# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
# මහා සභා රැස්වීමේ වාර්තාව.
# 2019.11.19

වර්ෂ 2019 ක් වූ නොවැම්බර් මස 19 වන අඟහරුවාදා දින පෙ.ව. 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ ඔක්තෝම්බර් මස මහා සභා රැස්වීමේ වාර්තාවයි.

**සහභාගීත්වය.**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
04. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
05. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
07. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
08. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
09. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
10. ගරු මන්ත්‍රිනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
11. ගරු මන්ත්‍රිනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
12. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
13. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
14. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
15. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
16. ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා
17. ගරු මන්ත්‍රිනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
18. ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
19. ගරු මන්ත්‍රිනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
20. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
21. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
22. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

මීට අමතරව ප්‍රාදේශීය සභා ලේකම් එල්.එච්. අනිල් රංජන් මහතා ද සහභාගී විය.

**<u>ආගම සිහි කිරීම හා සභාව පිළිගැනීම.</u>**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සියලුම ගරු සභිකවරුන්, ලේකම්තුමා ප්‍රධාන නිලධාරීන් හා මාධ්‍යවේදීන් පිළිගැනීමෙන් අනතුරුව පළමුව ආගම සිහිපත් කරන ලදී. ඉන් අනතුරුව විනාඩියක නිශ්ශබ්දතාවය රැකීමෙන් රට වෙනුවෙන් සටන් වැද මියගිය රණවිරුවන් හා මියගිය සභිකවරුන්, නිලධාරීන් හා සේවකයන් සිහිපත් කරන ලදී.

**<u>(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u>**

**<u>1) 2019.10.22 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019.10.22 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා සේ සලකා, විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන්න. නැත්නම් 2019.10.22 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව ලියා ඇති පරිදි ස්ථිර කරන ලෙස යෝජනා කරන්න. සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා** ඃ- 2019.10.22 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා** ඃ- එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා** ඃ- ගරු සභාපතිතුමනි පළමුව මම හිතන්නේ අභිනවයෙන් පත්වෙච්ච විධායක ජනාධිපති අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට මගේ සුභාශිංශනයත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සුභාශිංශනයත් පිරිනමනවා. ඒ වගේම මම හිතන්නේ හිටපු ජනාධිපති ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායක මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සිහිපත් කරනවා මේ අවස්ථාවේ දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන්. මොකද එතුමා අවසන් කටයුත්ත ලෙස සමනළ අඩවියත්, සෝමාවතී පුදබිමත් පූජා නගර ලෙස ගැසට් කළා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- මන්ත්‍රීතුමා ඔබතුමා වාර්තාවේ අඩුපාඩු පෙන්වා දෙන්න.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා** ඃ- ඒ ටික මතක් කරලා තමයි මම කියන්න යන්නෙ ඒ පුදබිම් දෙක ගැසට් කරලා එතුමා සමු ගත්තා. එතුමාට අපි අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආචාරය පුදකරනවා.

බොහොම සාමකාමී මැතිවරණයක් පැවැත්වීම පිළිබඳව සියලුදෙනාටම ස්තුතිවන්ත වෙනවා. මම හිතන්නේ බහුතරයක් සිංහල ජනතාවගේ ඡන්ද වලින් පත්වුණ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට, රට ජාතිය බබළවන්න අවස්ථාව උදාවේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා. මම හිතන්නේ සජිත් ප්‍රේමදාස මැතිතුමා ගැන එක වචනයක් හෝ සඳහන් කළ යුතුයි. නිහතමානී නායකයෙක් හැටියට එතුමා සමු ගත්තා. එතුමා සිය ධූරවලිනුත් ඉල්ලා අස් වුණා. ඒ ගැනත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් මගේ ආචාරය පුද කරනවා.

ගිය 2019.10.22 දින පැවති මහා සභාවේ මා විසින් කරන ලද ප්‍රකාශන කිහිපයක අඩුපාඩු තිබුණා.

6 වෙනි පිටුව.

“ 1999 දී මම ලංකාවේ ශක්තිමත්ම තරුණයා තෝරන තරගයට ඉදිරිපත් වුණා රටවල් 16 ක් එක්ක.” ඒක “ 1999 දී මම ලංකාවෙන් ශක්තිමත්ම තරුණයා තෝරන තරගයට ඉදිරිපත් වුණා රටවල් 160 ක් එක්ක.” ලෙස සංශෝධනය විය යුතුයි.

“මම හිතන්නේ ඒක සජීවීව ලබා දුන්නා.” ඒක “මම හිතන්නේ ඒක රටවල් 160 ක් ඔස්සේ සජීවීව විකාශය වුණා.” ලෙස සංශෝධනය විය යුතුයි.

ඒ වගේම ලංකාවේ ශක්තිමත්ම තරුණයා වීම ගැන මම සඳහන් කරා. ඒ ගැන විස්තරයේ යම් අඩුපාඩු ටිකක් තියෙනවා. ඒ ගැන මම මතක් කරනවා මේ අවස්ථාවේ. බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- ගරු සභාපතිතුමනි,

46 පිටුව

''දැන් ආණ්ඩුවෙන් පාර ලකුණු කරලා භාර දීලා ඉවරයි'' ඒක ''දැන් උසාවියෙන් පාර ලකුණු කරලා භාර දීලා ඉවරයි'' ලෙස සංශෝධනය විය යුතුයි.

48 පිටුව

''අපි කමිටුවලට විරුද්ධයි'' ඒක ''අපි කමිටු තීරණ වලට විරුද්ධයි'' ලෙස සංශෝධනය විය යුතුයි.

ගරු සභාපතිතුමනි, අළුත් ආණ්ඩුවක් පත්වෙලා තියෙනවා. හොඳ ලක්ෂණ කිහිපයක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- අබේසේකර මන්ත්‍රීතුමා මේක ඉවර කරලා කරමු.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා** ඃ- ගරු සභාපතිතුමනි,

**45 පිටුව**

''සභාවකින් එන යෝජනාවලට ගෞරවය කෙළසීමක් ඒවාට කිසිම පිළිවෙලක් කරන්නේ නැත්නම්'' ඒක ''සභාවකින් එන යෝජනා වලට ගෞරවය කෙළසීමක් ඒවාට කිසිම පිළියමක් කරන්නේ නැත්නම්''

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019.10.22 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධනවලට යටත්ව ඒකමතිකව සභා සම්මත විය.

**<u>(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අද ඉතාමත් ජයග්‍රාහී දිනයක්. මම ගිය සභාවේදී ප්‍රකාශ කළා ඊළගට අපි රැස්වෙන්නේ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ජනාධිපතිධූරයත් එක්ක කියලා. අද ඒ කාරණාව සභාවේ වෙලා තියෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, අපි කිරිබත් කාලා ඒක සැමරුවේ කොයි වෙලාවකවත් පාට පක්ෂ භේද අල්ලගෙන ගැටුම් ඇති කරගන්න නෙවෙයි. අපි ඉදිරියේ දී ප්‍රාදේශීය සභාවේ වැඩ කටයුතු කරගෙන යන්න සියලු දෙනාගේම සහයෝගය වෙනදාටත් වැඩියෙන් බලාපොරොත්තු වෙනවා. අපිට ප්‍රාදේශීය සභාවේ බලය ලබා දුන්නා. ආණ්ඩුව එක්සත් ජාතික පක්ෂයට තියෙද්දි, ජනාධිපති ධූරය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට තියෙද්දි එදා අපිට ප්‍රාදේශීය සභාවේ බලය ලබා දුන්නා ඡන්ද දායකයින් විසින්. ඉතිං අපි එදා ඉඳන් කිවුවේ මේ දෙක තුනම එක පැත්තට තියෙන්න ඕන කියන එක. අපි මේ රටේ ජනතාවට ස්තුතිවන්ත වෙනවා මේ කරුණු තේරුම් අරගෙන රටට අවශ්‍ය වෙලාවට, රටට අවශ්‍ය නායකයෙක්, පොළවේ පය ගහලා ඉන්න රටට අවශ්‍ය නායකයෙක් තෝරා පත්කර ගැනීම පිළිබඳව බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා විදියටත්, මන්ත්‍රී මණ්ඩලය විදියටත් අපි කෘතවේදී කෘතහස්ථ ජනතාවට අපේ කෘතවේදී , ගෞරවනීය ස්තුතිය පළ කරන්න ඕන. අපේ ප්‍රාදේශීය සභාවේ මුස්ලිම් මන්ත්‍රීවරයෙක් ඉන්නවා. අපි දැක්කා මේ මැතිවරණ ප්‍රතිඵලයත් එක්ක ජාතිවාදී ස්වරූපයක්. නමුත් ඊයෙ ඔබට පැහැදිලි වෙන්න ඇති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රකාශයෙන් එතුමා බලාපොරොත්තු වෙන්නේ ඒ ජාතීන් අතර තිබුන අනවබෝධය නැති කරගෙන ඉදිරියට එක රටක් විදියට එකට යමු කියලා. ඒ වගේම ඔබ දකින්න ඇති එතුමාගේ සංකල්පය අනුව කිසිම කාර්යාලයක දේශපාලඥයින්ගේ නාම පුවරු, බෝඩ් ගහන්න එපා කියන එක. ඒ වගේම වීථිවල පාරවල් වල සංවර්ධනය කිරීමේදීත් ඒක කරන්න එපා කියලා එතුමා දැඩි ස්ථාවරයක ඉන්නවා. අපි ඇත්තටම අගය කරනවා ජනාධිපතිතුමාගේ ඒ වර්තමාන දැක්ම පිළිබඳ, ඒ පිළිබඳව සඳහන් කරන්න ඕන. ඉතිං විශේෂයෙන් සභාපතිවරයා විදියට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ සුළු ජාතීන් නියෝජනය වෙනවා. ඒකෙදි මම කියාස් මන්ත්‍රීතුමාගෙන් මේ වෙලාවේ ඉල්ලා සිටිනවා අපිට ජනාධිපතිවරණයේ ප්‍රතිඵල ගිය විදිය කොහොම වුනත් අපි ප්‍රාදේශීය සභාව විදියට ඔබතුමාගේ කොට්ඨාශයේ එකට වැඩ කරමු. අපි කරන්න පුළුවන් උපරිම දේ කරා. අපි පළවෙනි අවුරුද්දේ මන්ත්‍රීවරුන්ට ලක්ෂ 10 ක් 11 ක් වෙන් කරා ප්‍රාදේශීය සභාව විදියට. ඉදිරියේදීත් අපි බලාපොරොත්තු වෙනවා කොට්ඨාශ 12ටම ඒ සාධාරණය කරන්න. ඒකෙදි අපි එකතු වෙලා වැඩ කරමු. අඩුපාඩු තියෙනවානම් ඒවා විවේචනය කරලා හදාගමු. අද සිට ඉන්නේ අපි අලුත් ජනාධිපතිවරයෙක් යටතේ. මම හිතනවා නුදුරේදීම අලුත් ආණ්ඩුවක් පත්වෙයි කියලා. එක්සත් ජාතික පක්ෂය එකඟ වෙලා තියෙනවා එක්කෝ මැතිවරණයකට ගිහිල්ල හරි එහෙම නැත්නම් අමාත්‍යධූර මාරු කරල හරි ආණ්ඩුවත් ජනාධිපතිවරයාගේ පක්ෂයට ලබා දෙන්න. ඉතිං ඒක තුළ අපිට ප්‍රාදේශීය සභාව විදියට කොහොම හරි ජනතාවගේ අභිලාශයන් ඉෂ්ඨ කරන ප්‍රාදේශීය සභාවක් කරගන්න අවස්ථාව ලැබිල තියෙනවා. ඒකෙදි සභාපතිවරයා විදියට මම ඉතාමත්ම සතුටු වෙනවා මේ අවස්ථාවේ දී තිබිච්ච යම් යම් අඩුපාඩුකම් හදාගෙන, මම නැහැයි කියන්නේ නැහැ. 2015 ජනවාරි 08 වෙනිදා මහින්ද රාජපක්ෂ මැතිතුමා පරාජයට පත් වුනේ අඩුපාඩු තිබුන හින්දා. ඒක අපි කවුරුත් අවිවාදයෙන් පිළිගන්න කාරණාවක්. අපි බලාපොරොත්තු වෙනවා, අපි ඒක දැනගෙන හිටියා. ඒ තිබුණ අඩුපාඩු අවුරුදු හතරක් හමාරක් තිස්සෙ තේරුම් ගත්තා. පහුගිය කාලෙත් තිබුණා. ඉතිං ඒ අඩුපාඩු ඇති කර අයත් මේ සැරේ එක්සත් ජාතික පක්ෂයේ වේදිකාවේ දක්නට ලැබුණා. ඒකෙදි දැන් හොඳටම තේරුම් අරන් ඉන්නේ වෙච්ච අඩුපාඩුකම් මොනවද ඉදිරියේ දී ඒ අඩුපාඩුකම් සම්පූර්ණ කරගන්නේ කොහොමද ඒ අඩුපාඩුකම් මගහැර ගන්නේ කොහොමද කියලා. රට ඉදිරියට ගෙනියන්නේ කොහොමද කියන එක රාජපක්ෂවරුන් තේරුම් අරන් ඇතියි කියන එක තමයි මගේ හැඟීම. ඒක තුළ අපි බලාපොරොත්තු වෙනවා ජනාධිපතිවරයාගේ ජනාධිපතිධූරයත් එක්ක, පත්වෙන අගමැතිවරයාගේ ධූරයත් එක්ක, ඒ වගේම අපේ දිස්ත්‍රික්කයට පත්වෙන කැබිනට් ඇමතිවරු හරහා ඒ සියල්ලම ඒකරාශී කරගෙන බෝපෙ පෝද්දල ජනතාවට දැනෙන්න වෙනසක් කරන්න අපිට අවශ්‍යතාවය තියෙනවා. එතනදි මම අවසාන වශයෙන් උප සභාපතිතුමා ඇතුළු සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාගෙන්, මන්ත්‍රීතුමියන්ලාගෙන් පක්ෂ විපක්ෂ සියලු දෙනාගෙන් ඉල්ලා සිටින්නේ අපි එක කඳවුරක් විදියට ඉඳගෙන තියෙන අඩුපාඩුකම් හඳුනාගෙන වැඩ කරමු කියන එක.

**(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම. ඃ-**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 01.** ක්‍රීඩා පාවහන් යුගලක් ලබා ගැනීම සඳහා අනුග්‍රාහකත්වය ලබා ගැනීම. (එම්.සී. කලංසූරිය මයා, ලේකම්, සිංහ ක්‍රීඩා සමාජය, පන්විල වත්ත, නරාවල, පෝද්දල)

අපි අර ගිය සභාවේදි පෝද්දල, නරාවල, ගජවත්තේ පදිංචි ජී. ඒ. ආර්. වසන්ත කුමාර මයා වෙත මැලේසියාවේ පැවැත්වෙන ප්‍රවීණතා මළල ක්‍රීඩා උළෙලට සහභාගී වීමට රුපියල් විසිදහසක මුදලක් සහා අරමුදලින් ලබා දීමට සභාවේ එකඟත්වය ලබා දුන්නා. නමුත් අපි ඒක යැවුවට පස්සේ කිව්වා ක්‍රීඩා සමාජයක් මගින් යෞවන සමාජයක් හරි හරහා ඉල්ලන්න කියලා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ජී. ඒ. ආර්. වසන්ත කුමාර මයා වෙත මැලේසියාවේ පැවැත්වෙන මාස්ටර් ප්‍රවීණ මළල ක්‍රීඩා උළෙල සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී වීමට අවශ්‍ය ක්‍රීඩා පාවහන් යුගල මිළදී ගැනීම සඳහා සහා අරමුදලින් රුපියල් විසිදහසක මුදලක් ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව ලබාදී අනුග්‍රහය දැක්වීමට මම යෝජනා කරනවා.

ඒ කාරණයට අතහිත දෙන්න කියලා මම තවදුරටත් ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න** ඃ- නැත

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාගේ යෝජනා**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 01.** 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 170 වෙනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් වැය ශීර්ෂයන් අතර මුදල් මහා සභාවේ ආවරණ අනුමැතියට යටත්ව 2019-11-05 දින මාරුකර තිබීම අනුමත කරන මෙන් යෝජනා කරමි.

| **ඌනතා වූ වැය විෂයන්** | | | **අතිරික්ත වූ වැය විෂයන්** | | |
|---|---|---|---|---|---|
| **වැය සංකේතය** | **වැය විෂය** | **වටිනාකම (රුපියල්)** | **වැය සංකේතය** | **වැය විෂය** | **වටිනාකම (රුපියල්)** |
| 105-9-2 | සංග්‍රහ වියදම් | රු.40,000.00 | 105-9 | වෙනත් වියදම් | රු.40,000.00 |
| 201-2 | අතිකාල හා නිවාඩු දින වැටුප් | රු.100,000.00 | 605-9 | වෙනත් වියදම් | රු.100,000.00 |
| 201-9 | වෙනත් දීමනා | රු.305,000.00 | 301-9<br>501-9 | වෙනත් දීමනා<br>වෙනත් දීමනා | රු.305,000.00 |
| 203-2 | ඉන්ධන හා ස්නේහක තෙල් | රු.200,000.00 | 303-2 | ඉන්ධන හා ස්නේහක තෙල් | රු.200,000.00 |
| 301-1 | වැටුප් හා දීමනා | රු.1,050,000.00 | 301-9 | වෙනත් දීමනා | රු.1,050,000.00 |
| 301-2 | අතිකාල හා නිවාඩු දින වැටුප් | රු.300,000.00 | 605-9 | වෙනත් වියදම් | රු.300,000.00 |

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**02.** බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ඇති සියලුම පෙර පාසල්වල දරු දැරියන් සඳහා රාත්‍රී කඳවුරක් සහා අරමුදලින් පැවැත්වීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මෙහෙම වුනාට පුළුවන් තරම් බාහිර පාර්ශවයන් වලින් ලබා ගන්න බලාපොරොත්තු වෙනවා. ඒ ගන්න බැරිම දේ සභා අරමුදලින් ලබා ගන්න තමයි බලාපොරොත්තු වෙන්නේ. ඒක දෙසැම්බර් මාසයේ දී කරන්න බලාපොරොත්තුවක් තියෙනවා. අපි බලමු ඒක.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** මම ඒ යෝජනාවත් එක්ක ඉල්ලීමක් කරනවා. ගරු සභාපතිතුමනි, මම යෝජනාවක් කරනවා ඒ යෝජනාවටම එකතු කරන්න කියලා. පෙර පාසල් ගුරුවරියන්ට රාත්‍රී කඳවුර කරන දවසෙම හෝ උපහාරයක් පුදන්න ක්‍රමවේදයක් සභාව මඟින් සකස් කරන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ එක්කම බලමු කරන්න. ඒකත් හොඳයි. බලමු මොකක්ද කරන්න පුළුවන් කියලා.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ- 03.** කරාපිටිය කොට්ඨාශය තුළ ඇති ඇළ මාර්ග සුද්ධ පවිත්‍ර කිරීමට අදාළ ආයතනයන් වෙත දන්වා යැවූවද කිසිදු පියවරක් මේ වන තෙක් ගෙන නොමැති නිසා ප්‍රජාවගේ ශ්‍රම දායකත්වය හා කුලී පදනම මත ලබා ගත් එක්ස්කැවේටර් යන්ත්‍රයක් යොදවා ජනතාව මුහුණපා ඇති ගැටළු අවම කිරීමට අදාළ ඇළ මාර්ගයන් සුද්ධ පවිත්‍ර කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** පහුගිය වකවානුව තුළ මාස ගානක් තිස්සේ දකුණු පළාත් වාරි මාර්ග දෙපාර්තමේන්තුවට, මාර්ග සංවර්ධන අධිකාරියට මම මේ ලිපි යොදවලා ඉල්ලීම් කළා. පහුගිය ගංවතුර කාලේ බෝගහවේල්ලේ වෛද්‍ය නාමල් ගමගේ මැතිතුමාගේ ගෙදර ගාව තියෙන හීන් ඇළ අවහිර වීම නිසා ප්‍රදේශයේ නිවාස කිහිපයක් යට වුණා. දැන් අපි සභාව හැටියට එක්ස්කැවේටර් යන්ත්‍රයක් සහ ප්‍රදේශයේ ජනතාවගේ ශ්‍රමදායකත්වය යොදවන්න පුළුවන් ශක්තියෙන් යොදවලා ඒ ටික සුද්ධ කරලා තාවකාලිකව හරි ජනතාව මුහුණපා ඇති ගැටළු අවම කිරීමට කටයුතු කරන්න මම යෝජනා කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට මිළ ගණන් කැඳවලා ඒ විදියට කරන්නම්. ඒක පුළුවන් තරම් ඉක්මනට කරමු.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** හීන් ඇළ සුද්ධ කරාට හීන් ඇළ කියලා මේ අය දැනට සුද්ධ කරන්නේ උළුවිටිකේ පැත්තෙ තියෙන වෙන ඇළක්. හීන් ඇළ කියන්නේ ජස්ටින් කන්දෙන් පටන් අරගෙන කුකුළගහ හරහා හෝළුවාගොඩට දුවන ඇළ. හැබැයි මුදල් පාස් වුණා හීන් ඇළ කියලා. ඒත් කරන්නේ හෝළුවාගොඩ පැත්තේ වෙන ඇළ මාර්ගයකට යොදවන එක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැබැයි මන්ත්‍රීතුමා ඇළවල් සුද්ධ කරනවානම් හාජ් එකක් ඕන වෙනවා. හාජ් එකක් එක්ක තමයි මිළ ගණන් කැඳවන්න වෙන්නේ. ඉදිරියට මිළ ගණන් කැඳවන්නම් හාජ් එකක් රහිතව සහ හාජ් එකක් සහිතව.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එහෙම කපන්න වෙන්නේ මීටර් 300 පමණ ප්‍රමාණයක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වාරි මාර්ග දෙපාර්තමේන්තුවට අයත් නැති ඇළවල් තමයි අපිට සුද්ධ කරන්න වෙන්නේ මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒ කොටස වාරි මාර්ග දෙපාර්තමේන්තුවට අයත් නෑ කියල කියනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට එහෙන් ලියුමක් අරගෙන තමයි කරන්න වෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් ඇත්තට පහුගිය කාලේ දිගටම ඇළවල් සුද්ධ කරා. බලාගෙන යන්න ඒ ඇළවල් තියෙනවද කියලා. ඉස්සර ඇළක් සුද්ධ කරාම සාමාන්‍යයෙන් කාලයක් පවතිනවා. පවතින්න හේතුව තමයි දෙපැත්තෙ කිතුල් පටි ගහල හරි මොකක් හරි කරනවා. දැන් ඒක නැතුව ඇළවල් සුද්ධ කරගෙන යනවා. ඊට පස්සෙ ඒක තියෙන්නේ නෑ. සම්පූර්ණයෙන්ම යනවා. ඒක නිසා මම ලියනගේ මන්ත්‍රීතුමාගේ යෝජනාවට කියනවා ප්‍රාදේශීය සංවර්ධන කමිටුවට ඉදිරිපත් කරලා ඇළවල් භාරනවා නම් ඒ ඇස්තමේන්තුවට ඇතුළත් කරන්න ඒ දෙපැත්තේ වැටි වලට ගහන එකක්. ඒ විතරක් නෙවෙයි මම හිතන්නේ ඇත්තටම මේක සදාකාලිකවම නඩත්තු කරන්න වෙන්නේ මෙහෙන්. මේ දෙපැත්තේ ඉන්න ගොවියන්ට මොකක්හරි ක්‍රමවේදයක් හදලා දෙන්න ඒ ඇළ ප්‍රමාණය සුද්ධ කරන්න. ඒක කරනවානම් හොඳයි. නැත්නම් මේකට හැමදාම සල්ලි දානවා විතරයි. ඊළඟට තව එකක් තියෙනවා පාරක් නම් කොනක් කරාට කමක් නෑ. ඊළඟට සල්ලි ආවම කරන්න පුළුවන්. නමුත් වැඩක් තියෙන්නේ ඇළක් එක කොනකින් විතරක් කරාට වැඩක් නෑ. වතුර බැහැලා යන්න තැනක් නෑ. ඒ නිසා මේකටත් අවධානයක් යොමු කරලා විධිමත් යෝජනාවක් විදියට ඉදිරිපත් කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ- 04.** සභාව සතු ජල බවුසර්වල ඇති අඩුපාඩු සකස්කර භාවිතයට ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එතනදි සභාපතිතුමනි, මිනිස්සුන්ට පිරිසිදු ජල බවුසරයක් ලබාදීමේ දී අපි බලන්නේ නෑ කොන්ක්‍රීට් එකක් අනන්න ගෙනියනවද පානීය ජලය විදියට පාවිච්චි කරන්න ගෙනියනවද කියලා. මේක කොන්ක්‍රීට් අනන තැන් වලටත් ගිහින් ජලබවුසර් ගොඩක් අපිරිසිදු වෙලා තියෙනවා. ඒක අපි හදාගන්න ඕන.

ඊළඟට දිරාපත්ව ඇති බවුසරයක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක අබලි වලට අයින් කරන්න වෙනවා. ඇතුළෙන් දිරුවට පස්සෙ වැඩක් නෑ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** පානීය ජලය සඳහා ලබාදෙන ජල බවුසරය ඒ සඳහා පමණක් හඳුනාගෙන ලබා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා මේ වෙලාවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ- 05.** සභාව සතු දැනට භාවිතයට නොගන්නා යන්ත්‍ර හා උපකරණ අළුත්වැඩියාකොට භාවිතයට ගැනීමට හෝ අළුත්වැඩියා කළ නොහැකි තත්වයේ ඇති යන්ත්‍ර හා උපකරණ වෙන්දේසි කිරීමටත් යෝජනා කරමි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මොකද දැන් මේ ජල බවුසරය ප්‍රයෝජනයට ගන්න බැරුව දිරාපත් වෙවී කුණු ගොඩවල් බවට පත් වෙනවා. ඒවා මේ භූමිය තුළ පවත්වාගෙන යනවට වැඩිය හොඳයි වෙන්දේසි කරන එක. ඒ සඳහා කටයුතු කරන්න කියලා යෝජනා කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

මීළඟට කිරිබත් ලෑස්ති කරලා තියෙනවා. සියලු දෙනාටම කිරිබත් කෑමට ආරාධනා කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** හැම සභාවකම කිරිබත් වගේ දෙයක් දෙන්න. අපි ඉස්සර කරා ඒක.

( ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය සභා ගර්භයෙන් පිටවීම සිදුවිය. )

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම මේ සභාවට යෝජනා දාන්න අවස්ථාව තිබුනත් යෝජනා දැම්මේ නෑ. මොකද සභා වාර්තාවේ දෙවැනි පිටුවේ තියෙනවා ගරු කියාස් මන්ත්‍රීතුමා කරපු ප්‍රකාශයක්. ''දාහත් වෙනිදායින් පස්සේ ඔක්කොම ප්‍රාදේශීය සභා ටික අපි විසිරුවනවා'' කියලා. ඉතිං මම හිතුවා යෝජනා දාලා වැඩක් වෙන්නේ නෑ කියලා. මොකද සභාව විසුරුවයි එහෙම උනොත් තේරුමක් නෑ කියන කාරණාවට.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මම එහෙම කිවුවේ නෑ. මම කිවුවේ විසුරුවන්න පුළුවන් කියන එක.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** මේකෙ තියෙන්නේ ඒ විදියට. සභා වාර්තාවේ තියෙන්නේ ඒ විදියට. ඔබතුමා කියලා තියෙන්නේ ඒ විදියට.

( ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය සභා ගර්භයෙන් පිටවීම සිදුවිය. )

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එන්න ඔක්කොම කිරිබත් කන්න.

**(තේ පානය සඳහා සභාව කල් තබන ලදී.)**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** උප සභාපතිතුමාට අදහස් ප්‍රකාශ කිරීම සඳහා අවස්ථාව ලබා දෙනවා. උපරිම විනාඩි 5 කට සීමා කරන්න සියලු දෙනාම.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, සහෝදර මන්ත්‍රීවරුනි , මන්ත්‍රීවරියනි අද දවස ඉතාම සුභ දිනයක්. මොකද පහුගිය දාසයවෙනි දින මේ රටේ දේශපාලන පෙරළියක් සිදුවෙලා විධායක ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ඓතිහාසික ජනවරමක් ලබා ගැනීමෙන් නැවතත් මේ රටට වාසනාව උදා වුන දිනය හැටියට සියලුදෙනා, සිංහල, දෙමළ, මුස්ලිම් වේවා සියලු ආගම් වේවා සියලු දෙනාගේම පැතුම වුනේ මේ රටට නැවත බියෙන් සැකෙන් තොරව ජීවත් වීමේ අයිතිය, හෙට උපදින දරුවන්ගේ ආරක්ෂාව ඒ සියල්ලටම ඍජු උත්තරයක් ලබාදෙමින් ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණේ අපේ අපේක්ෂකයා වූ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා අති විශිෂ්ඨ ජයග්‍රහණයක් ලබා ගනිමින් පහුගිය දිනයේ රුවන්වැලි සෑය අභියසදී දිවුරුම ලබා දුන්නා. ඒ නිසා සියලු දෙනාම ලබාදුන්න ශක්තියට, බෝපෙ පෝද්දල ජනතාවට ප්‍රාදේශීය සභාවේ නියෝජ්‍ය සභාපතිවරයා හැටියට ඉතාමත්ම කෘතවේදීත්වය පළ කරනවා ඒ දුන්න සහයෝගයට. ඒ වගේම තමයි එක්සත් ජාතික පක්ෂයේ පාලන සමයේ අපි විටින් විට ප්‍රකාශ කරා සිදු වුණ අඩුපාඩු ගැන නායකයාට දැනුම් දෙන්න කියලා. මොකද ඒ තුළින් ගමේ අපිත් එක්ක ජීවත් වෙන ජනතාවට වුණ අඩුපාඩුව සභාව තුළ කතා කරද්දි අපි කල්පනා කරා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු හරහා  අදාළ දේශපාලන අධිකාරිය දැනුවත් වුණා කියලා. ඒක කිසිසේත්ම සිදුනොවුන බව පහුගිය ජනවරමෙන් අපිට තේරුම් ගන්න පුළුවන් වුණා. විශේෂයෙන්ම පාසල් දරුවන්ගේ නිල ඇඳුම අහිමි කිරීමත්, රණවිරු දඩයමත් ඒ වගේම බැඳුම්කර සිද්ධියත්, ඒ වගේම රටේ ආර්ථිකය බලා ඉද්දී කඩා වැටීමත් ජනතාවගේ බලාපොරොත්තු සියල්ල සුනුවිසුණු වෙනකොට මිනිස්සු මේ පාලනය දැක්කේ ඉතාමත්ම දුර්දාන්ත පාලනයක් හැටියට. වසර හතරක ඒ දුර්දාන්ත පාලනය අවසන් කරලා හෙට බිහිවන අපේ රජය යටතේ නැවතත් ඒ සාමකාමී පරිසරය, ආරක්ෂාව, අවනීතිය වෙනුවට නීතිය රජකරන සමාජයක් තමයි මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ අගමැතිත්වයෙන් බිහි කරන්නේ. අපිට, ගාලු දිසාවට අයෝමය ශක්තියක් ලබා දුන්නු මගේ දේශපාලන නායක වෛද්‍ය රමේෂ් පතිරණ මැතිතුමාට නොබෝ දිනකින්  ගාලු ජනතාවගේ එකම පැතුම වුනු නායකයාට, දකුණට අභිමානයක් එක් කරන්න ඒ නායකත්වයට සුදුසු අවශ්‍ය නායකත්වය පෙන්වන්න ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා අවස්ථාව ලබාදෙයි කියන දැඩි විශ්වාසයක් බෝපෙ පෝද්දල වගේම ගාල්ලේ ජනතාවටත් තියෙනවා. අපේ පැතුම ඉටුවන දිනය, හෙට හෝ අනිද්දා වේවි. ඒ තුළින් සියලු ජනතාවට පෙර සේ රමේෂ් පතිරණ මැතිතුමා අක්මීමණ ජනතාවට සිතු සේවය ඉටු කරන්න සැදී පැහැදී සිටිනවායි කියමින් නැවතත් අපේ නායක අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට සුභාශිංශනය එක්කරමින් සියලුදෙනාම එකමුතුව එක රොදකට බැඳිලා බෝපෙ පෝද්දල ජනතාවගේ කාර්යභාරය ඉටු කරන්න කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** සමස්ථ සභාවෙන්ම අවසරයි. මේ පැවතුණු ජනාධිපතිවරණයේ දී ඇත්ත වශයෙන්ම ප්‍රබල පක්ෂ දෙකක් අතර තිබුන සටනකින් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපති ලෙස තේරී පත්වුණා. අපි එතුමාට උණුසුම් සුභ පැතුම් මේ අවස්ථාවේ දී පිරිනමනවා. ඒ වගේම මේ මැතිවරණයේ දී සභාපතිතුමත් අපේ තවත් මන්ත්‍රීවරු ප්‍රකාශ කළ ආකාරයට මුස්ලිම් ජනතාව, දෙමළ ජනතාව බහුතරය ඡන්දය ලබාදීල තියෙන්නේ සජිත් ප්‍රේමදාස මැතිතුමාට. නමුත් ඒක ජාතිවාදී, අන්තවාදී කියලා ප්‍රකාශ කරන්න බැහැ. හේතුව සජිත් ප්‍රේමදාස මහත්තයා කියන්නේ බෞද්ධයෙක්. අපි මෙතනදී හිස්බුල්ලාට ඡන්දය ලබාදුන්නේ නෑ. එහෙම නැත්නම් අපේ මුස්ලිම් කෙනෙකුට හෝ දෙමළ කෙනෙකුට ඡන්දය ලබාදුන්නේ නෑ. පහුගිය ආණ්ඩු කාලේදී සිදු වෙච්ච නොයෙකුත් සිදුවීම්, සුළු ජාතිකයන්ට සිදුවෙච්ච නොයෙකුත් සිදුවීම් නිසා ඒ මුස්ලිම් ජනතාව හෝ ද්‍රවිඩ ජනතාවගේ හිතේ තියෙන බයක් නිසා තමයි මෙවැනි ආකාරයේ ප්‍රතිඵලයක් ඇති වුනේ. නමුත් අපි හිතන්නේ නෑ ඒ ප්‍රතිඵලය අපේ ජනාධිපතිතුමාට ඇතිවෙයි කියලා. ජනාධිපතිතුමා ප්‍රකාශ කළ ආකාරයට ඉස්සරහට එතුමා ඒක හරියට කරනවා කියලා. ඒ

ආකාරයෙන්ම එතුමා රට පාලනය කරොත් ඒක වෙනස් වෙන්න පුළුවන්. එහෙම නැතුව මිනිස්සු ඡන්දය විරුද්ධව ගැහුවා නොවෙයි. ඒ මිනිස්සුන්ගෙ හිතේ තිබුණ සැකය නිසා එතුමලාගේ ආණ්ඩුවට සහයෝගය ලබා දුන්නු බලවේග සියල්ලම සහයෝගය දැක්වුවේ ඒ පැත්තට. ඒ නිසා තමයි මිනිස්සුන්ගෙ හිතේ සැකය ඇති වුනේ. ඒ සැකය නිසා තමයි මිනිස්සු ඒ ආකාරයෙන් තීන්දුවක් ප්‍රකාශ කරේ. නමුත් ජනාධිපති කෙනෙක් වුණාම එතුමාට සුළු ජාතිය කියලා එකක් නෑ. රටේම ජනාධිපති. රටේ ජනාධිපති වශයෙන් මේ රටට යහපතක් කරනවා නම් සියලු ජනතාවට එකසේ සළකනවානම් ඒක නිසි ආකාරයට වෙනස් වෙයි. ඒ වගේම මේ මැතිවරණයේ දී දැකපු විශේෂතාවය තමයි මේ මැතිවරණය පවත්වපු අවස්ථා වල මැතිවරණයක් තිබුනද කියලා දැනුනේ නෑ අන්තිම මොහොත වෙනකම් ජනතාවට. හේතුව පෝස්ටර් කවුරුවත් ගහන්න ගියේ නෑ. බැනර් එහෙම ගහන්න ගියේ නෑ. එවැනි පරිසරයක් ඇති කරේ කවුද කියන එක මේ රටේ කවුරුත් දන්නවා. රටේ එවැනි ආකාරයේ පරිසරයක්, විදේශ රටවල මැතිවරණයක් පවත්වන්නේත් මේ ආකාරයට. ඒවගේ වාතාවරණයක් රට තුළ ඇති කරා. ඒ වගේම මැතිවරණ කොමිෂන් සභා පත් කරා. නොයෙකුත් කොමිෂන් සභා පත් කරා. මේ ආණ්ඩුව වැරදි කිහිපයක් සිදුකරා. හොඳ දේවල් අපිට දැන් වැරදියි කියලා තමයි කියන්න වෙන්නේ. මේ රට තුළ වෙනදා ගුරුවරයෙක්, විදුහල්පතිවරයෙක් මාරු කරන්න ඕන වුනාම දේශපාලඥයෙකුට කතා කරාම කෝල් එකක් දීලා මාරු කරන්න පුළුවන්. නමුත් ඒ වාතාවරණය දැන් නෑ. කොමිෂන් සභා පත් කරලා තියෙනවා. කොමිෂන් සභාවෙන් තමයි තීරණය කරන්නේ ඒක. පොලීසියේ නිලධාරියෙක් මාරු කරන්න තීරණය කරන්නේ පොලිස් කොමිෂම. හැම එකටම කොමිෂන් සභා පත් කරලා රටේ යම්කිසි දේශපාලනීකරණය නොකර තත්ත්වයක් උදා කරලා තියෙනවා. නමුත් එහෙම උදා කරාම මිනිස්සු යම් යම් තීන්දු තීරණ ගන්නවා. එතකොට තත්ත්වය වෙනස් වෙනවා. ඒ වෙනස්වීම තුළින් වර්තමාන ජනාධිපතිවරයා ලෙස ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා පත්කරලා තියෙනවා. අපි ඉල්ලා සිටිනවා අපේ ආණ්ඩුවේ ඉන්න මන්ත්‍රීවරු සියල්ලටම අයින් වෙලා, අගමැතිතුමත් අයින් වෙලා වර්තමාන ආණ්ඩුවට ඔවුන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාත්මක කරන්න අපේ කැබිනට් මණ්ඩලයත් ඉවත් වෙලා සම්පූර්ණයෙන්ම බලය පොහොට්ටුවට ලබාදෙන්න ඕන. දීලා විපක්ෂයේ ඉන්න ඕන. විපක්ෂයේ ඉඳගෙන ඔවුන්ට අවස්ථාව දෙන්න ඕන ඒක කරගෙන යන්න. නමුත් අපි කවදාවත් කකුලෙන් අදින්නේ නෑ. 2015 දී අපි ආණ්ඩුව ගනිපු දවසේ ඉඳලා මාසයක් ගියේ නෑ උද්ඝෝෂණ පටන් ගත්තා. මම හිතන්නේ දවසකට දෙක ගානේ උද්ඝෝෂණ රැළි පැවැත්වුවා. කිසිම කෙනෙක්ට හානියක් කරේ නෑ. ඒ නිදහස ලබා දුන්නා. නමුත් යම්කිසි ආණ්ඩුවක් පත්වුනාම කාලයක් ලබාදෙන්න ඕන ඒක කරගෙන යන්න. ඒ මනුස්සයට ලබාදෙන්න ඕන අවස්ථාව ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරගෙන යන්න. ඒ නිසා වර්තමානයේ අපේ රජය ඒවාට බාධා කරන්නේ නැතුව අපිත් ඒවාට උදවු කරන්න ඕන. ඔවුන්ගේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්න ඕන. රටේ ජනතාව පිළිඅරගෙන තියෙනවා ඒවා ක්‍රියාත්මක කරගන්න. ක්‍රියාත්මක කරන්න ඕන අද ඉඳන්ම. අපි ඉල්ලීමක් කරනවා එක්සත් ජාතික පක්ෂයටත් අපේ අගමැතිතුමාටත් කැබිනට් ඇමති මණ්ඩලයටත් ආණ්ඩුව ලබාදීලා අවස්ථාව ලබාදෙන්න. දීලා ඇත්තටම කරගෙන යන්න දෙන්න. පාර්ලිමේන්තුව විසුරුවන්න කාලය තියෙනවා. ඒ කාලය තුළ පළාත් සභා මැතිවරණය තියන්න. පළාත් සභා මැතිවරණය තියන්න කියලා මැතිවරණ කොමසාරිස්තුමත් කිවුවා. දැන් මූලික වෙලා තියෙන්නේ පාර්ලිමේන්තුවට වඩා පළාත් සභාව. පළාත් සභා ක්‍රමය වෙනස් කරනවානම් ඒකටත් අපි සහයෝගය ලබා දෙනවා. පළාත් සභා මැතිවරණය තියන්න. පාර්ලිමේන්තු මැතිවරණයට තව කල් තියෙනවා. එදාට අපි ඉතුරු වැඩසටහන බලමුයි කියන ප්‍රකාශය කරමින් වර්තමාන ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට අපගේ උණුසුම් සුභ පැතුම් එකතු කරමින් මම නිහඬ වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාගේ කතාවේ එක නිවැරදි කිරීමක් කරන්න අවශ්‍යයයි. ඒක ප්‍රතිවිරෝධී ආකල්පයක් නෙවෙයි. නමුත් ඔබතුමාගේ කතාවේදී කියවුනා පෝස්ටර් සංස්කෘතිය වෙනස් කරේ ඔබතුමාගේ රජය කියලා. ඒක වැරදියි. මොකද පෝස්ටර් සංස්කෘතිය වෙනස් කරේ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා. ඒකෙ ගෞරවය මම එතුමාට තියනවා. මම ඒකේ හොඳ කතාවක් කියන්නම්. ඔබතුමාලා මැතිවරණය පටන් ගත්ත ගමන්, නොමිනේෂන් දුන්න ගමන් පෝස්ටර් ව්‍යාපාරය ගියා. එතකොට අපිට ලොකු බලපෑමක් ආවා. රමේෂ් පතිරණ මහත්තයට අපිත් කිවුවා. රැල්ල දැන් අරෙහෙම හැදිල තියෙන්නේ කියලා. එතකොට කිවුවා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ඉන්න ස්ථාවරය. කාර්යාල වලට විතරක් පෝස්ටර් එවුවා. අපේ මෙරුන් පාට දේවල් අඩුයි කොළ පාට දේවල් වලට වැඩිය. ඒක නිසා කාර්යාලයට විතරක් පෝස්ටරයක් එවුවා. ඒ ඇරෙන්න කිසි තැනක ගහන්න එපා කිවුවා. ඒ සංස්කෘතිය වෙනස් වුනේ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගෙන්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඔබතුමා එහෙම ප්‍රකාශකරත් ඒක එහෙම නෙමෙයි සිද්ධ වුණේ. මැතිවරණ කොමසාරිස්තුමා ප්‍රකාශකර සිටියා, දැඩිව කියා සිටියා දැඩිව ක්‍රියාත්මක කරනවා කියලා කොමිෂන් සභාවේ බලතල.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි තර්ක කරන්න අවශ්‍ය නෑ. ඉස්සෙල්ලම පෝස්ටර් ගැහුවේ ඔබතුමන්ලා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මැතිවරණ කොමසාරිස්තුමාට මැතිවරණ කොමිෂමෙන් බලය ලබා දුන්නා. ඒ බලතල වලට පොලිස් කොමිෂම දැඩිව හිටියා. කිසිම පෝස්ටරයක් ගහන්න දෙන්නේ නෑ කිවුවා. ගැහුවොත් අල්ලලා රිමාන්ඩ් කරනවා කිවුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මන්ත්‍රීතුමා හැමදාම තිබුණා. හැමදාම පෝස්ටර් අඩු වැඩි වශයෙන් කවුරුත් හොරෙන් ගහනවා. නමුත් අපි නිදහස් මේ සැරේ. අපි එක පෝස්ටර්යක් ගැහුවේ නෑ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒක තර්ක කරන්න දෙයක් නෙමෙයි. කොමිෂන් සභාවට දීපු බලතල කොමිෂන් සභාව ක්‍රියාත්මක කරා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි දිගට යන්න ඕන නෑ. සජිත් එන්නත් කලින්, නම් කරන්නත් කලින් සජිත් එනවා කියලා පෝස්ටර් ගැහුවා. ඊට පස්සේ නම් කරාට පස්සේ තව පෝස්ටරයක් ගැහුවා. ඒක ගැන කතාව ඇති.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, සජිත් එන්න කලින් පෝස්ටර් ගැහුවා නෙමෙයි. සජිත්ගේ තාත්තත් ගැහුවා. "මේ කවුද මොකද කරන්නේ කියලා" කියලා පෝස්ටර් මතක නම්. කෙහොම හරි එකක් තියෙනවා ධන පැත්තේ සිදුවීම් වෙනවා ඍණ පැත්තේ සිදුවීම් වලට වඩා. ඒක හොඳයි. හැබැයි එහි සම්පූර්ණ ගෞරවය ඇත්තටම පැවති රජයට හිමිවිය යුතුයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ඔබතුමාට එක දෙයක් කිවුවා. සමාවෙන්න ඕන මෙහෙම කරනවට. ඔබතුමා අහද්දි මම කිවුවා ලක්ෂ 15ක් 20ක් අතරේ මම කිවුවේ. තව එකක් කිවුවා. ඔබතුමා ඒක කීයටවත් එන්නේ නෑ කිවුවා. ගම්පහ දිස්ත්‍රික්කය මම කිවුවා ලක්ෂ තුන හමාරකින් දිනනවා කියලා. ඒක කීයටවත් වෙන්න බෑ කිවුවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා ඒක කිවුවා. මම ඒ මතයේ හිටියේ නැත්තේ මගේ විග්‍රහයේදී එහෙම දෙයක් ආවේ නෑ මට. මට දැන් වෙනස් විග්‍රහයක් තියෙනවා. දෙයක් වුණාම, ඕන මිනිහෙක්ට වැරදුනාට පස්සේ හැරිලා බලන්න ඕන. මම ඉස්සෙල්ලම ගෝඨාභය රාජපක්ෂ මහත්තයාට සුභ පතනවා. පැවති වාතාවරණය එක්ක සාධාරණ මැතිවරණයක් පැවැත්වුවා. ඒ ගෞරවය ආණ්ඩුවට යන්න ඕන ආණ්ඩුවක් විදියට කොමිෂන් සභා ඇති කරලා වැඩ කරාට. එතුමා අපි හිතනවා ඉතා නිවැරදිව වැඩ කරයි කියලා. ඒ ධෛර්යය ශක්තිය එතුමාට තියෙනවා. ඒ වගේමයි සජිත් ප්‍රේමදාස මැතිතුමා. මම එතුමාගෙන් පටන් ගන්නේ වෙන කිසි දෙයක් හින්දා නෙමෙයි මගේ පොඩි කාලය තුලදී. ඕන කෙනෙක් වැරැද්දක් වුණාම නැවත ආපස්සට හැරිලා බලන්න ඕන මට වැරදුනේ කොහොමද කියලා. මිනිස්සු වෙනස් විය යුතුයි. ඔබතුමන්ලාට මම මතක් එහෙම ඔබතුමන්ලාට මතක ඇති අපි කවුරුත් ගෞරව කරපු මාදුළුවාවේ සෝභිත ස්වාමීන්වහන්සේව. උන්වහන්සේගේ ඇත්තටම පොඩි ජාතිවාදී ස්වරූපයක් තිබුණා. බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ ඇත්තටම ඒක තියෙනවා. ඒක ධර්මයේ කියපු දෙයක් නෙමෙයි. පොඩි ජාතිවාදී ගතියක් තියෙනවා. ඒක එච්චර හොඳ නෑ. නමුත් එකක් තියෙනවා අපවත් වෙන වෙලාව වෙනකොට මාදුළුවාවේ සෝභිත ස්වාමීන්වහන්සේ ඉතාම ඉහල තැනක හිටියේ ධර්මයට අනුව. ධර්මානුකූලව ධර්මයට අනුව ඉතාම ඉහල තැනක හිටියේ ජාතිය, ආගම, කුලය ප්‍රතික්ශේප කරමින්. උන්වහන්සේ තමයි ඇත්තටම පහුගිය යහපාලන ආණ්ඩුව, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ගේන්න සම්පූර්ණ වැඩ කොටසක් කරේ. සමහර වෙලාවට උන්වහන්සේ හිටියා නම් අර විදියට නෙමෙයි පපුව පැළිලා අපවත් වෙන්නත් ඉඩ තිබුණා. ඉතින් ඊලගට ඇත්තටම මම හිතන්නේ, මම එකෙන් කියන්න ගියේ මොකක්වත් නෙමෙයි. මිනිස්සු වෙනස්විය යුතුයි. බොහොම පැහැදිලිව බුදුන් වහන්සේ කිසිම ආගමක් නිර්මාණය කරලා නැහැ. "ජීවිතය හා විශ්වාස යථා ස්වාභාවයෙන් පැහැදිලි කරන ලදි. එය බුද්ධියේ ධර්මයකි. හාස්කමක් නොවේ. එහි හාස්කමක්ද නැත." ඒ කියන්නේ අදෘශ්‍යමාන දේවල් නෑ. ඇත්තටම අද රට ගිහිල්ලා තියෙනවා බොහොම නරක තැනකට. අදෘශ්‍යමාන බලවේග ඒවා මේවා. දැන් අර නැකැත්කාරයෝ කට්ටියක් කිවුවා කැට තියලා සජිත් දිනනවා කියලා. තව කට්ටියක් කැට තියලා මෙහෙම කිවුවා. මේක හරි ලේසි කියමනක් නැකැත්කාරයොන්ට කියන්න තියෙන්නේ. මොකද මේ දෙකෙන් එකක්නේ වෙන්නේ. හරි ලේසියි. ඒකට පොඩ්ඩක් පටලවන්න ඕන දේ තමයි මීන රාශියෙන් මේකට ආවාම, මේෂ රාශියෙන් අරකට ගියාම, මේක උච්ච වුණාම එහෙම. මේක වුණාම මෙහෙම, ඕක කියන්න ඉගෙනගන්නවා නම් ඔබතුමන්ලාට අපිට තමයි ලේසියෙන්ම කරන්න පුළුවන්. ඒක හින්දා ඔබතුමාට පුළුවන් මට කියපු දේවල් එක්ක අනාවැකි කියන්න. කියන්න ගියේ

මොකක්වත් නෙමෙයි. මේ රටට අවශ්‍යයි ඉතාම පැහැදිලිව සියලු ජාතීන් එක්කහු වෙච්ච, සියලු ජාතීන්ට නායකත්වය දෙන තත්වයක් තමයි ඇතිවෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තව එකක් මතක්වුණ නිසා කියන්නේ. තව අනාවැකියක් කිව්වා. ඔබතුමා ඒකට කීයටවත් එකඟවුණේ නෑ. ප්‍රාදේශීය සභා මැතිවරණයේදී මම කිව්වා කොට්ඨාස 11ක් දිනනවා කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම කිව්වේ ඒකයි. ඔබතුමාට මේ සුදුසුකම් ඔක්කොම ඇවිල්ලා තියෙනවා. පොඩි බෝ පැළයක් ඕන නම් සුමිත් උප සභාපතිතුමාගෙන් ඉල්ලුවා නම් ගන්න පුළුවන්.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා බයවෙන්න එපා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඇත්තටම වඩා වැදගත් වන්නේ විහිළුවෙන් මේ සියලු දේවල් කිව්වේ වෙන මුකුත් හින්දා නෙමෙයි. ඇත්තටම කැටි කරලා ගත්තම ඒකයි තියෙන්නේ. ලෝකේ දියුණු වෙච්ච කිසිම රටක් ජාතිය, ආගම, කුලය ගනිපු තැනක දියුණු වෙලා නෑ. මම විශ්වාස කරනවා අද වෙනකොට මම හිතන්නේ අපේ මහින්ද රාජපක්ෂ මැතිතුමා පැරදිච්ච වෙලාවේ, අපි එතුමාට කවදත් ගරුකරා මනුස්සකම් වලට. ඒවා නැහැයි කිව්වේ නෑ. හැබැයි එකක් තියෙනවා. එතුමාට වැරදුනු තැනක් තිබුණා. අනවශ්‍ය විදියට මේ සිංහල - බෞද්ධ ඡන්ද බලාපොරොත්තු වුණා. හැබැයි මේ පාර එතුමා ඒ ටාගට් එක ජය ගත්තා. ඒක පසුකරා. පසුකරන්න හාමුදුරුවරු ඉතාම පැහැදිලි දායකත්වයක් දුන්නා. හැබැයි මතක තියා ගන්න. මම අර කියපු දේ තමයි නැවතත් කියන්න වෙන්නේ. මේ මනු වේෂයෙන් ඉන්න ගෞරවනීය හාමුදුරුවන්ගෙන් අපිට ඉල්ලන්න තියෙන්නේ රට නම් ගිනි තියන්න එපා කියන එක. බොහොම ගෞරවයෙන් ඉල්ලන්නේ වෙන්නේ අපේ හාමුදුරුවන්ගෙන් ඔබතුමාලා ලොකු දෙයක් කරා. ඔබවහන්සේලා හිතපු විදියට ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ගෙනාවා. එතුමාට නිරවුල්ව මේක කරගෙන යන්න ඉඩ දෙන්න. හැම තිස්සෙම සිංහල ජාතියයි, අරකයි මේකයි, අර කුලෙයි මේ කුලෙයි, අරගෙන ඔලුව වන කරන්නේ නැතුව එතුමාට ඒ ටික කරගෙන යන්න දෙන්න. බලාගෙන ඉන්න. වැරැද්දක් කරනවා නම් අනුශාසනා කරන්න. මම හිතන්නේ ඔබතුමාලා දන්නවා බොහොම පැහැදිලිවම, ඉතාම පැහැදිලිව බලන්න පහුගිය දවස්වල මරණ දණ්ඩනයට නියම වෙලා හිටපු, හිරේ හිටපු අර හිල්ටා ජෝන්ස් නඩුවේ විත්තිකාරයාව නිදහස් කරා. මොන තරම් හෙන ගහන අපරාධයක්ද ඒක. ඊට වැඩිය නොදැනුවත්ව වෙච්ච මිනී මැරුම් කරපු මිනිස්සු හිටියා. රටක් මෙහෙම යන්න ගියොත් කොහොමද යන්නේ. ඒක කරන්න තරම් මෘග මට්ටමට ගියා. මේක අනුගමනය කරමින්ම අපේ ගෞරවනීය ස්වාමීන්වහන්සේලා සමා වෙන්න. මොන පදනමක් යටතේ කොහොම කරාද කියලා මම දන්නේ නෑ. ලොකු ලිස්ට් එකක් ඉදිරිපත් කරා. මෙන්න මේ අය, රණවිරුවෝ නිදහස් කරන්න කියලා. රණවිරුවෝ නම්, ඇත්තටම වැරැද්දක් කරලා නැත්නම් ඒවා ඉක්මනට අහලා ඉවර කරලා දාන්න. හැබැයි රණවිරුවෝ කියලා දැන් ඔබතුමාලා දන්නවා 71 කැරැල්ල වෙලාවේ ඇල්ෆඩ් විජේසූරියට එල්ලුම්ගහ දුන්නා ඒ අපරාධයට. එයා රණවිරුවෙක් වුණේ නෑ එදා. ඒක හින්දා මේක බුද්ධියෙන් යන ගමනක් වුණොත් රටට ලොකු වැඩ කොටසක් කරගන්න පුළුවන්. ඉතින් අපිට වෙච්ච දේවල් ආපස්සට හැරිලා බලාගන්න ඕන. බලනකොට අපිට වැරදිච්ච තැන් තියෙනවා. මොකද එකමුතුකම නැතිවුණාම වෙන දේවල් තියෙනවා. මට නම් ඒ ඉවසීම නෑ සමහර වෙලාවට. රනිල් වික්‍රමසිංහ ආදර්ශයට ගන්න ඉවසීමට. මම හිතන්නේ එතුමා ඇඩි පීඩනයක් මැද්දේ තමයි මේ සටනේ හිටියේ. එතුමා මේකට දෙන්න ඕන සියලු නායකත්වය ලබා දුන්නා. එතුමාගේ පැත්තෙන් පක්ෂ නායකයා විදියට, යූ.ඇන්.පී කාරයෙක් විදියට, අගමැති හැටියට දුන්නා. දැන් ඒකට වැරදි අර්ථකතන කිසි දෙයක් දෙන්න එපා කියන ගෞරවනීය ඉල්ලීම කරනවා. දැන් මම ඉන්නේ යූ.ඇන්.පී එකේ. මට හෙට එල්.ටී.ටී.ඊ එකට යන්න ඕන නම් යනවා. හැබැයි මම ඒ පැත්තෙයි, මේ පැත්තෙයි දෙපැත්තෙම අඩිය ගහගෙන ඉන්නේ නෑ. මම දේශපාලනයෙන් සමුගන්නවා කියලා ඔබතුමන්ලාට කිව්වා බොහොම පැහැදිලිවම. මම මේ දේශපාලනයෙන් ඇත්තටම සමුගන්න ඉන්න මිනිහෙක්. ඥාති කතා එහෙම නෙමෙයි. මේක විහිළුවක් නෙමෙයි. මන්ත්‍රීවරුන් චෝදනා කරන්න එපා හැමදාම කතා කරා කියලා. මේ විහිළුව දිගට කරන්න එපා. මම මගේ කතාව නවත්වන්නම්. මම කියන්න තියෙන්නේ වෙන කිසි දෙයක් නෙමෙයි. සමගියෙන් වැඩ කරගෙන යන්න. හැබැයි එකක් තියෙනවා. මම තව පොඩ්ඩකින් යනවා. මට යන්න වෙන හින්දා මම ප්‍රගතියේදී ඔබතුමාට කියන්න තියෙන දේ කියනවා. මම ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටියා. මේ අනවසර ඉදිකිරීම්, ගොඩ කිරීම් සම්බන්ධව ඔබතුමන්ලා අපි එකට සටන් කරපු දේවල් තියෙනවා. දැන් හරි ඒවා නිවැරදි කර ගන්න මහන්සි ගමු. අලුත් ආණ්ඩුවක්නේ දැන් තියෙන්නේ. ගොඩක් වැඩ කරන්න පුළුවන්. දැන් මේ නිවැරදි දේ කරන්න. මම ඉල්ලා සිටිනවා ඉතාම මංකොල්ලයක් වෙච්ච කපුහෙම්පල නන්දිමිත්‍ර විද්‍යාලයේ ඒ ඉඩම ඉතා අයුතු විදියට හොර

රහසේ මේවා කරපු ඒ කුඨ ලේඛන හදලා පවරා ගනිපු ඉඩම. දැන් නායකත්වයට ඉදිරිපත් කරන්න මේ ඉඩම් මංකොල්ලයට කාටවත් ඉඩ දෙන්න එපා කියලා. මම හිතන්නේ මීට වැඩිය මම කතා කරන්නේ නෑ. අපි විශේෂ සභාවක් ඉල්ලගෙන මීට වැඩිය දේවල් කතා කරමු. කතා කරන්න දේවල් ගොඩක් තියෙනවා. අපි විශ්වාස කරනවා සියලු දෙනාටම නිවැරදි මග පෙන්වයි කියලා. ඔබතුමන්ලාත් වැරදි යෝජනාවල් ගෙනැල්ලා මේ ආණ්ඩුවේ නායකයා වෙච්ච ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ඔලුව අවුල් කරන්න එපා. නිවැරදිව කරගෙන යන්න දෙන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඔබතුමා සුභ පැතුවේ නැනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම සුභ පැතුවා බොහොම පැහැදිලිවම. මම ඉස්සෙල්ලම සුභ පැතුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පුද්ගලිකව සුභ පතලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම ඉස්සෙල්ලම සුභ පැතුවේ වෙන විදියකින් නෙමෙයි. මේ රාජ්‍ය ලාංඡනය විතරක් දාලා පින්තූර නොගහ ඉන්න එක තමයි එතුමා ගනිපු ධනාත්මකම වැදගත්ම දේ. මොකද හේතුව බලන්න වෙන කිසි දෙයක් කරන්න ඕන නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි ආදර්ශය දීලා තියෙන්නේ ඊට කලින්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා දන්නවා මේ කන්නයේ නෙමෙයි, මීට ඉස්සෙල්ලා වතාවේ පවා ඔය බෝඩ් ගහනවට මම විරුද්ධයි. මොකද මඩ ගහන්න ඕන නෑ. මාස 2ක් 3ක් යනකොට බල්ලෝ කෑවා වගේ අරක අව්වට වේලිලා ගිහිල්ලා. මේක කැතයි. ඒක වැඩක් නෑ. මේක දීර්ඝකාලීනව පවතින දෙයක් නම්, බිල්ඩින් එකක් හැදුවා නම් කමක් නෑ එකේ ඵලකයක් දැම්මට. ස්තුතියි.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඉස්සෙල්ලම මම සුභ පතනවා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මේ රටේ ජනාධිපතිවීම සම්බන්ධව. ඒ වගේම ඒකට සහයෝගය ලබාදීපු මහින්ද රාජපක්ෂ මැතිතුමාට. ඒ වගේම මම හිතන්නේ මේ මැතිවරණය කරේ බොහොම අපහසුතාවයෙන්, අමාරුවෙන්, අගහිගකම් තුල. ඒ අගහිගකම් තුල අපි කරලා මේ තත්වයට මේක ගේන්නේ මම හිතන්නේ. ගාල්ල දිස්ත්‍රික්කය ගත්තොත් අපේ රමේෂ් පතිරණ මැතිතුමා, මොහාන් පී. ද සිල්වා මැතිතුමා, ඒ වගේම පළාත් සභාවේ හිටපු මැති ඇමතිවරු, ඒ වගේම ගරු සභාපතිතුමන්ලා, ඒ වගේම උප සභාපතිතුමන්ලා, ඒ වගේම නගරාධිපතිතුමන්ලා වගේම සියලුම මැති ඇමතිතුමන්ලා ඉන්නවා. ඔබතුමන්ලා කෙසේ කීවත් මේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු ඉතා විශාල කැප කිරීමක් කරා ගෙන් ගෙට ගිහිල්ලා. අපි දන්නවා මේක කරේ අගහිගකම් තුල. මේක නැවත කියන්න ඕන. ඊට අමතරව අපේ සියලුම සංඝයාවහන්සේලා ඒ අතර එක නමක් දෙනමක් ඉන්න ඇති. අනෙක් සියලුම සංඝයාවහන්සේලා අපිව දැන්වත් කරා. මම ඒ ගැන කියන්නේ එච්චරයි. ඒකට මම ස්තුතිවන්ත වෙනවා. ඊට අමතරව මම කියන්න ඕන උතුරේ ජනතාව හොඳ පාඩමක් අපිට ඉගැන්වූවා. ඒ තමයි 84%ක් ඡන්දය අරගෙන සජිත් ප්‍රේමදාස මහත්තයා උදේ පාන්දර ඒ පැත්ත දිනනවා. අපේ කට්ටියගේ පපුව ඩිග් ඩිග් ගගා හිටියේ. ගෑනු අයට ගණන් හදන්න තේරෙන්නේ නෑ. උදේ පාන්දර ප්‍රතිඵලය එහෙම දුන්නා. උතුරු නැගෙනහිර ප්‍රතිඵලය කවදාවත් එහෙමයි තිබුණේ. එදා තිබුණට වැඩිය අද ඒක වැඩියෙන් පෙන්නුවා උතුරු නැගෙනහිර. නිකන් නෙමෙයි එහෙම දේවල් කරේ. හේතු තිබුණා. ඔබතුමන්ලා දන්නවා ඉල්ලීම් 13ක් ඉල්ලුවා. මේ ඉල්ලීම් 13ටම සජිත් ප්‍රේමදාස මහත්තයා කැමති වුණා. ඒ කැමති වුණ නිසා තමයි ඒ ප්‍රදේශවල ජනතාව ඒ දීපු ඡන්දෙත් එක්ක බැලුවම මුස්ලිම් ජනතාව, දෙමළ ජනතාව සියලු දෙනාගේ ඡන්දය එතුමාට ලබා දුන්නේ. එහෙම ලබාදෙනකොට අපිට හිතන්න පුළුවන් මොකද වුණේ කියලා. නමුත් ජාතියක් විදියට අපිටත් හිතන්න සිද්ධ වුණා යම් මට්ටමකට. අපිට 62%- 65% ක් දක්වා අපේ ජාතිය ගියා. නමුත් එහෙම ගිහිල්ලා තමයි දහතුන් ලක්ෂ හැට දහසකින් අපි මැතිවරණය ජයග්‍රහණය කරන්නේ. අපි ජයග්‍රහණය කරනකොට 85%ට ගියා නම් තව ලක්ෂ විසි හතරකින් විතර ජයග්‍රහණය කරන්න ඉඩකඩ තිබුණා. අපි එහෙම නම් ඉදිරි මැතිවරණ වලදී මේක ආදර්ශයට ගන්න ඕන. මහින්ද රාජපක්ෂ මැතිතුමත් කිවුවා. මමත් කියනවා. සිංහල ඡන්ද වලින් ජයග්‍රහණය කරා. හැබැයි සියලු ජාතීන්ට ජනාධිපතිවරයා විදියට මම මගේ කරන්න තියෙන සෑම කටයුත්තක්ම සිද්ධ කරනවා කියලා එතුමා කිවුවා. අපි එතුමාට ඒකේදී ස්තුතිවන්ත වෙනවා. අපි ජාතිවාදී නෑ. අපිට ඕන රටක්. අපිට ඒ අවශ්‍යතාවය ඉෂ්ඨ කරනවා කියන එක පැහැදිලියි අතිගරු ජනාධිපතිතුමා. මම මගේ කාලය දීර්ඝ වශයෙන් ගන්නේ නෑ. එම නිසා අපි බලාපොරොත්තු වෙනවා ඉදිරි කාලය තුල මේ රට ස්වයංපෝෂිත රටක් වෙලා 2020 වෙනකොට. වැව් ටික පිරිලා තියෙන්නේ. 2020දී රටට හොඳ සංවර්ධනයක් කරන්න පුළුවන්. වැව් ටිකෙන් එන ජලය ගත්තම කුඹුරු ටික අස්වද්දලා මේ රටේ අනිත් දේවලුත් අස්වද්දලා සියලු දේ කර ගන්න අවස්ථාව ලැබෙයි. ඒකත් මේ

පිනට සිදු වෙච්ච දෙයක්. ජනාධිපති විදියට පත්වුණ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට හා ඉදිරියේදී අපේ පත්වන අගමැතිතුමා ඇතුළු කැබිනට් මණ්ඩලය ඒ ප්‍රයෝජනය ලබා ගනීවි. ලබාගෙන මේ රටේ සියලු ජනතාවට සාධාරණය කරන්න කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඔබතුමා කිවුව විදියටම නොවැම්බර් මාසයේ සභාව අලුත් ජනාධිපතිවරයෙක් යටතේ පවත්වන්න සිදුවෙලා තියෙනවා. මේ රටේ ජනතාවගෙන් බහුතරයක්, 52.25%ක ප්‍රමාණයක් මැතිවරණ ප්‍රතිඵලය ලබාගෙන ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ජනාධිපති අපේක්ෂක ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මේ රටේ හත්වන විධායක ජනාධිපතිවරයා වශයෙන් තේරී පත්වුණා. ඒ ගැන අපි ඇත්තටම මේ රටේ ජනතාවගේ ජනමතයට එකඟවෙමින්, ඒ ජන මතයට ගරු කරමින් අපි එතුමාට මේ රටේ ජනාධිපති විදියට පිළි ගනිමින් ඒ වගේම ඉදිරියට එතුමා ඉදිරිපත් කරපු ප්‍රතිපත්තිය, විවිධ කණ්ඩායම්, විවිධ පක්ෂ තම තමන්ගේ මතය, ප්‍රතිපත්තිය ඉදිරිපත් කරා රටට. රටේ බහුතරයක් යම් යම් තත්වයන් තුල එකිනෙකාට වැටහීමේ ප්‍රමාණය අනුව තම තමන් තෝරා ගනිපු ප්‍රමාණයන් තුල තමන්ගේ අභිමතය ප්‍රකාශයට පත්කරේ. එතුමාට දැන් අවස්ථාව ලැබිලා තියෙනවා එතුමා ඉදිරිපත් කරපු ඒ මැතිවරණ ප්‍රකාශයට අදාළ කරුණු කාරණා ඉදිරියේදී මේ රට තුල තහවුරු කරලා තමන්ගේ මතය, වැඩපිළිවෙල සමාජ ගත කරන්න. විශේෂයෙන්ම මේ අවස්ථාවේ, මේ මැතිවරණයට මුහුණදීපු අපි පක්ෂයක් ලෙස ජාතික ජන බල ව්‍යාපාරය ගොඩනගලා සන්ධානයක් හැටියට පොදු ක්‍රියාවලියකට ගිහිල්ලා ජනතා විමුක්ති පෙරමුණත් ඊට ඇතුල්වෙලා මැතිවරණයට මුහුණ දුන්නා. ඒ මැතිවරණයේදී 418,000 ක ඡන්ද ප්‍රමාණයක් අපේ රටේ ජනතාව ජාතික ජන බලවේගය වෙනුවෙන් පාවිච්චි කරා. ඒ සියලු දෙනාටම මම අවස්ථාව කර ගන්නවා මේක ස්තුතිය පුද කරන්න. ඒ වගේම මේ ඡන්ද ප්‍රතිඵලය කීපදෙනෙක් කතා කරනකොට විග්‍රහ කර ගත්තා ප්‍රතිඵලය කොහොමද නිර්මාණය වෙලා තිබුණේ කියලා. ඒ නිර්මාණය වූ ඡන්ද ප්‍රතිඵලයේ අපිට පේන අඳුරු පැතිකඩ තමයි වෙන මොකක්වත් නෙමෙයි රටේ ජාතිකත්ව පදනමෙන් ඉර ඇඳෙන මැතිවරණයක් බවට පත්වුණා. ඒකට විවිධ හේතු කාරණා බලපෑවා. විශේෂයෙන්ම පහුගිය කාල වකවානුවේ රට තුල ඇතිවෙච්ච පාස්කු ප්‍රහාරය, ඒ වගේම ඒ හරහා ත්‍රස්තවාදී බියක් රට තුල ගොඩනැගුණා. ඒවා සිංහල ජනතාව අතර ඉතා දැඩිව ජන මානසිකත්වය කළඹන සිද්ධීන් වුණා. ඒ වගේම තමයි උතුරේ දෙමළ ජනතාවටත් සිංහල ජාතිවාදය පෝෂණයවීමට එරෙහිවීමේ මානසිකත්වයක් ගොඩනැගුවා. රටේ සිංහල හෝ දෙමළ හෝ රටේ උතුරු නැගෙනහිර, දකුණ වශයෙන් ජාතිකත්ව පදනමෙන් මැතිවරණය තීරණාත්මකව බෙදුණා. ඒක අපි දැක්කා උතුරු නැගෙනහිර 80%ක් ඉක්මවා ගියා, හැම ප්‍රදේශයක්ම ගෝඨාභය රාජපක්ෂ මහතාට එරෙහිව පාවිච්චි වුණා. මේක කලින් මහින්ද රාජපක්ෂ මහතා ඉදිරිපත්වුණ අවස්ථාවේදීවත් තිබුණ තත්වයක් නෙමෙයි. මේ මෑත කාලය තුල ඉතා වේගයෙන් අපේ රට ජාතිවාදය දක්වා තල්ලුවුණා. මේක නරක ප්‍රවණතාවයක්. මේ ප්‍රවණතාවය මොන ආණ්ඩුව තිබුණත්, මොන කණ්ඩායම තිබුණත්, මොන කණ්ඩායම බලයේ හිටියත් මේක වෙනස් කරන්න ඕන. පරාජය කළ යුතු එකක්. මෙතනදී අපේ සුගත් මන්ත්‍රීතුමා කිවුවා සිංහල බහුතර ජනතාවගේ ඡන්දයෙන් ජයග්‍රහණය කරා කියලා. ඒ කාරණයට ගෝඨාභය රාජපක්ෂ මැතිතුමත් කිවුවා කියලා එතුමා කිවුවා. එහෙම වුණත්, එම බලාපොරොත්තු වුණ සහයෝගය ඒ ප්‍රදේශවල ජනතාවගෙන් නොලැබුණත් රටේ සියලු ජනතාවගේ ජනාධිපතිවරයා විදියට ක්‍රියා කරනවා කිවුවා. ක්‍රියාත්මක වෙනවා කියලා කිවුවා. ඒක එතුමා භාවිතයෙන් ඔප්පු කරලා පෙන්විය යුතු දෙයක්. අපි හිතනවා එතුමාට එහෙම හැකියාව ලැබෙයි කියලා. මේ මැතිවරණයේදී එතුමා ඉදිරිපත් කරපු ප්‍රකාශනය අනුව එතුමාට විශාල වැඩ කොටසක් මේ රටේ ඉස්සරහට කරන්න තියෙනවා. විශේෂයෙන්ම මේ මැතිවරණයේදී බොහෝවිට කතා බහට ලක්වුණු රටේ ආරක්ෂාව, එතනින් එහාට ගියාම ආර්ථික බිඳවැටීම, ඊලඟට රට තුල සිදුවුණ අනාරක්ෂිතබව හා වාර්ගික පිරිහීමට අදාළ ක්‍රියාමාර්ග එතුමාගේ වගකීම හැටියට පැවරිලා තියෙනවා. එතුමා ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඉදිරිපත් කරපු විදියට මේ රටේ දැවෙන ප්‍රශ්නයක් වෙච්ච බදු බර අඩු කරලා ඒ කියපු ක්‍රියාමාර්ග ගන්න ඉදිරියේදී අවස්ථාව ලැබෙන්න කියලා අපි ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම මේ මැතිවරණයේ අපි දකින හොඳම දේ වෙන්නේ දැන් අපි කරන ප්‍රාර්ථනාවක් නෙමෙයි. මේ ප්‍රාර්ථනා වලින් ඔබ්බට ගිහිල්ලා ඉදිරියේදී මේක භාවිතය ඇතුලේ රට අත්විඳින යහපත් අයහපත් තත්වයන් තුල තමයි අපිට මේකේ බර කිරලා මැනලා බලන්න වෙන්නේ. ඒ නිසා අපි බලා ඉන්නවා ඒ ඉදිරි ක්‍රියාමාර්ග ඇතුලේ මේ රට කොයි පැත්තට යනවද, රට නිවැරදි දිශාවට යන්න අපි අපේ පැත්තෙන් කරන්න පුළුවන් මැදිහත්වීම කරන්න මේ මොහොතේ සූදානමින් ඉන්නවා. මේ අතරේ අපි විශ්වාස කරනවා. එතුමා ප්‍රකාශ කරා "මගේ විධායක බලය පාවිච්චි කරන්න කිසිවිටෙකවත් පසුබට වෙන්නේ නෑ" කියන කාරණය. ඒ ප්‍රකාශය එතුමාගේ ශක්තියක් බවට පත් කරන්න පුළුවන්. විධායක බලතල හා ලැබුණු බහුතර බලය පාවිච්චි කරලා මේ පහුගිය කාලේ, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලේ සිදුවුණ ඉතාමත් නරක ඛේදවාචකයක් වෙච්ච, මේ රටේ ආර්ථිකයට හෙන ගහපු මහ බැංකු කොල්ලය, ඒ කොල්ලයේ ඇත්ත චූදිතයන්ට, ඒ ඇත්ත වැරදිකරුවන් දැන් රටට එළි කරලා දඬුවම් කරලා ඒ වෙච්ච අලාභය අය කරන්න කටයුතු කරයි කියලා, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව කටයුතු කරයි කියලා අපි හිතනවා. පාස්කු ප්‍රහාරය, පසුගිය දවස්වල

මැතිවරණ වේදිකාවේ කියපුවා, දැන් අවස්ථාව ලැබිලා තියෙනවා මේවා නිවැරදි කරලා වැරදිකරුවන්ට දඬුවම් කරලා මේ රටට සාධාරණය ඉෂ්ඨ කරන්න. මේ තත්වය ඇතුලේ රටේ ඉදිරි ක්‍රියාමාර්ගවලට මේ අලුත් ආණ්ඩුව, අලුත් ජනමතයට මේ රටේ පාලකයොන්ට හිස නවන්න වෙනවා. දැන් ආණ්ඩුව මොන පක්ෂය යටතේ තිබුණත් ජනමතය වෙන තැනක තියෙනවා. ඒ ජනමතයට ඉඩදිය යුතුයි. ඒ නිසා ආණ්ඩුවට වගකීමක් තියෙනවා දැන් අලුත් ජනමතයට ඉඩකඩ සලසන්න. මේ තත්වය යටතේ අලුත් රටේ හෙට දවස ගැන අපි අවධියෙන් ඉන්නවා. රටේ ජනතාවට අපි කියනවා අවධියෙන් ඉන්න. රට නිවැරදි දිශාවට ගෙනියන්න. මොන ආණ්ඩුවක් පත්වුණත් ඒ ආණ්ඩුවට අවශ්‍ය දිශාවට ගෙනියන්න පුළුවන්, බලපෑම කරන්න කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉක්මනට ඉක්මනට අදහස් ප්‍රකාශ කරන්න. කාලය ගතවෙනවා වැඩියි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, සභාවේ පාලක බලය හිමි කණ්ඩායම හැටියට අපිටත් පුදුමාකාර සතුටක් තියෙනවා. අපි ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපති අපේක්ෂකයා විදියට නම් කරන්න කලින් මේ සභාවේ ඒකමතිකව යෝජනාවකින් ඉල්ලීම කරා. අපේ අපේක්ෂාව මේක, ගමේ අපේක්ෂාව මේක ඒ නිසා මෙතුමව නම් කරන්න කියලා. ඒ අපේක්ෂකයා නම් කරලා ඉවරවෙලා අපි අද එතුමාව මේ රටේ 7වන විධායක ජනාධිපති ලෙස පත්කරන්න රටේ ජනතාව අපිට ශක්තිය ලබාදීලා තියෙනවා. ඒ වෙනුවෙන් අපි සියලුම දෙනාටත්, අපේ කෘතවේදීත්වය පුද කරනවා. ඒ වගේම එතුමා ගැන ජනතාව තබපු විශ්වාසය රැකගෙන ඉදිරියට යන්න හැකියාව, ශක්තිය ලැබේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම එතුමාට සුභ පතනවා. ඒ වගේම අබේසේකර මන්ත්‍රීතුමා දැන් මේ පහුගිය කාලය තුල අපේ ජාතික නායකයාගේ ජයග්‍රහණයට කර දුන්න මහා සංසරත්තය පිළිබඳව ප්‍රකාශයක් කරා. මම ඇත්ත වශයෙන්ම ජාතිවාදියෙක් හැටියට මේ මැතිවරණය එනකම් කතා කරේ නෑ. හැබැයි ජාතිකවාදී අදහස් අපි අතරත් තිබුණා. හැබැයි එළියට දැම්මේ නෑ. ඒ ගැන කතා කරේ නෑ. අබේසේකර මන්ත්‍රීතුමාට කවදාවත් භික්ෂූන්වහන්සේලා ගැන, මේ ගැන කතාකරනකොට, උතුරේ යෝජනා 13ක් ඉදිරිපත් කරනකොට, පහුගිය සභා වාරයේදී ඒ ගැන කතා කරේ නෑ. මුස්ලිම් ජනතාවට බදුර්දීන්ලා අන්තවාදී අදහස් දෙනකොට කතා කරේ නෑ. ඒ පිළිබඳව මේ අවස්ථාවේදීත් කතා කරේ නෑ. හැබැයි මැතිවරණ ප්‍රතිඵල ආව වෙලේ ඉඳලා අපිටත් පොඩි චෝදනාවක් ආවා. ඇයි අපිට ජාතියක් විදියට මෙහෙම වෙලා තියෙන්නේ කියලා. බහුතරය මුස්ලිම් ජනතාව අන්තවාදය පෝෂණය වූ තැන ඉඳගත්තා. බහුතරයක් දෙමළ ජනතාව බෙදුම්වාදී අදහස් ලඟ හිටගත්තා. ඊට පස්සේ භික්ෂූන් වහන්සේලා රට ආරක්ෂා කරන්න අන්තවාදී තැනකට ගියේ නෑ. එතුමාට හරි මාර්ගෝපදේශය ලබා දෙමින්, ගෝඨාභය මහතාට නිවැරදි දිශාව පෙන්වමින්, සිංහල බෞද්ධ ජනතාවට දිශාව පෙන්නුවා මෙන්න මේකයි රට කියලා. මේ ගැන අදහස් දක්වන්න අපි පහුගිය කාලය තුල ජාතිවාදී තැනක හිටියේ නෑ. හැබැයි මැතිවරණ ප්‍රතිඵලය බැලුවම පැහැදිලිවම පේනවානේ මොකද වුණේ කියන එක. ඒ නිසා මම පැහැදිලිවම කියනවා අපිට ශක්තිය ලබාදීපු භික්ෂූන් වහන්සේලාට ඒ වගේ චෝදනාවක් කිරීම මම දැඩි සේ හෙලා දකිනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම සහරාන්ලාටත් විරුද්ධයි. ඥානසාරටත් විරුද්ධයි. ඒක බොහොම පැහැදිලි දෙයක්. ඒක මට මගේ උප්පත්තියෙන් උරුම දෙයක්. විරුද්ධ වෙන්න ඕන දේට මම විරුද්ධ වෙනවා. මම දන්නේ නෑ ඔබතුමාලා ඒක හාස්‍යයට ගන්න තැනකට ගියාට හැම තැනකම ඉන්නවා නරුමයෝ. එකේදී මම මේ භික්ෂූන් වහන්සේලාට අගෞරව කරා නෙමෙයි. සිංහල බෞද්ධ ඡන්ද ටික අරගෙන දුන්නා. දැන් හැබැයි සිංහල බෞද්ධ කියන එක විතරක් ගෙනියන්න එපා. දැන් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා නිරවුල්ව දැක්කා මට ඒ සහයෝගය හම්බවුණේ නෑ කියලා. මොකද පොඩි අවිශ්වාසයක් තිබුණනේ. අවිශ්වාසය නැති කරන එක අපිනේ කරන්න ඕන. පොඩි සතා ලොකු සතාට බයයි. අපි ඕන සහන දෙන්න. ඉල්ලීම් 13 ගැන නම් මම ශත පහකට විශ්වාස කරන්නේ නෑ. මේ රට බොහොම පැහැදිලිවම බෙදන්න බෑ. ඒවා බොහොම පැහැදිලිවම ව්‍යවස්ථාවෙන් ඇවිල්ලා තියෙනවා. දේශපාලනයේදී ගලකින් ගහලා මැතිවරණය දිනන්නේ කොහොමද කියලා බලනවා. ඒක වෙන කතාවක්. එහෙම දෙයක් නෑ. එහෙම ගිවිසුම් ගහලා ඇත්තේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඉතින් ඒ වෙනුවෙන්, අපේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා අපිත් එක්ක ඒ වෙලාවේ ප්‍රකාශයක් කරා මහ බැංකු වංචාව හා පාස්කු ප්‍රහාරය ගැන. හැබැයි එතුමාගේ නායකයා තමයි ඒ දෙකේදීම ඒ පැත්තේ හිටගෙන හිටියේ. මම හිතනවා එතුමා ඒ ප්‍රකාශය මෙතන වගේම එතුමාගේ පක්ෂය ඇතුලේ ඉහල තලයටත් ප්‍රකාශ කරන්න කියමින්

මම නැවත වතාවක් 7වන විධායක ජනාධිපති ගෝඨාභය රාපක්ෂ මැතිතුමාට සුභාසිංශන එක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, සියලුම මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි, මමත් සතුට නිහතමානීව භුක්ති විඳිනවා මේ මොහොතේ. අදහස් ප්‍රකාශ කිරීම ඉතාම කෙටියෙන් කරන්නයි බලාපොරොත්තු වන්නේ. මම කියන්න හිටිය බොහෝ දේවල් ලියනගේ මන්ත්‍රීතුමා ප්‍රකාශ කරා. ඒ නිසා අපි මොනවා කිවුවත්, මේ ලෝකයේ බුදු දහම තියෙනවා. මේක බුදුන් වැඩිය රටක්. ඒ නිසා කාටවත් අනවබෝධයෙන් වැරදි ක්‍රියාමාර්ග කරලා අවසන් මොහොතේවත් හොඳින් මැරෙන්න බෑ. කොයි වෙලාවක හෝ ඒක පඩිසන් දෙනවා. ඒක බුදු දහමෙන් අපි ඉගෙන ගනිපු දෙයක්. ඒ නිසා මැතිවරණ ව්‍යාපාරයට ආපු වෙලාවේ ඉඳලා අවසාන මොහොත දක්වාම බොහොම ඉවසීමෙන්, වගකීමෙන්, නිහතමානීව කටයුතු කරපු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට දිගින් දිගටම වියරු වැටිච්ච මොක්කුන්ද වගේ මඩ ප්‍රචාර, බොරු ප්‍රචාර, මඩ පෝස්ටර් පුලුවන් තරම් කරා. ඒ කරපු සියලු දෙනාට දැන් බුදු දහම අනුව දිට්ඨධම්මවේදනීය කර්මය පඩිසන් දීලා තියෙනවා. ඔවුන්ට කිසිදු ඇඳුමක් ඇඳගෙන පාර්ලිමේන්තුවට ගිහිල්ලා කතා කරන්න බැරි තත්වයට ඔවුන් කතා කරා සියලු සමාජයන්ට. විද්‍යුත් මාධ්‍ය හරහා අපි දැක්කා රාජිත සේනාරත්න මහත්මයා, ඇමතිතුමා මොනවාද කරේ, මොනවාද කිවුවේ, මොන තරම් විහිළු කතාද සමාජයට පැවසුවේ. මංගල සමරවීර හිටපු ඇමතිතුමා මෙනවාද නොකිව්වේ පරාජය කරන්න. නමුත් අපි සියලු දෙනාම, මම බොහොම නිහතමානීව කියන්නේ පහුගිය හැම සභාවකම බෙහොම ඉවසීමෙන් හිටියා. නිකරුනේ කෑගැහුවේ නෑ. මොකද දන්නවා මේ ඇත්ත වෙනවා කියලා. ඒ නිසා ඔබ හැමදෙනාටම කතා කරනවා ජාතිවාදය ගැන. අපි අතර ජාතිවාදයක් නෑ. මේ සිංහල බෞද්ධ රට ඇතුලේ සියලුම ජාතීන් සමගියෙන් ජීවත් වුණා. ඒක ඇත්ත. හැබැයි ඒ අය විතරක් සිංහලුන් සුළු ජාතිය බවට පත් කරන්න යනවා නම් අපි සිංහලුන් හැටියට ඇයි නිහඬව ඉන්නේ. ඒකයි මගේ මතය. ඔවුන් සියලු දෙනා එකතු වෙලා සිංහල සුළු ජාතියක් බවට පත් කරන්න යනවා නම් ඇයි අපි නිහඬව ඉන්නේ. අපි එකතු වෙන්න ඕන එක්සත්ව. අපි කවදාවත් ප්‍රකාශ කරන්නේ නෑ. සුළු ජාතියත් ඉන්න ඕන. අපි ඔක්කොම එකට ජීවත් වෙන්න ඕන. මේ පුංචි රටේ ලස්සනට ජීවත් වෙන්න ඕන. දැන් ඒ අයත් හිතන්න ඕන අපි ගැන. ඒ අයත් හිතන්න ඕන සිංහලයෝ ගැන. ඒ නිසා නෙමෙයිද උතුරු නැගෙනහිර මේ ආකාරයේ ප්‍රතිඵලයක් ලබා දුන්නේ. එතකොට ඇයි දකුණේ ඉඳගෙන ඒ අයත් එක්ක එකතු වෙන්න ගියානම් මොකද වෙන්නේ. අන්තිමට වෙන්නේ ඒ අයට අපිට යටත් වෙලා ඉන්න. මහ ජාතිය කියලා එකක් නැති වෙනවා මේ රටේ. අපි කවදත් විරුද්ධයි ජාතිවාදයට. අපි ඒකට එකඟ නෑ. අපි ඔක්කොම එකට ජීවත් වෙනවා. දෙමළ මිනිස්සු ඉන්නවා අපේ ගම්වල. අපේ වතුවල වැඩට එනවා. මුස්ලිම් අය ඉන්නවා අපි ඒ අයත් එක්ක ව්‍යාපාර කරනවා. අපි බොහොම සතුටින් ජීවත් වෙනවා. හැබැයි ඒ අයගේ යටින් යන මතය සිංහලයෝ විදියට අපි තේරුම් ගන්න ඕන. තේරුම් අරගෙන අපි ඒ අයව එකතු කර ගන්න ඕන. අපේ සිංහල ජනතාව කියනවා නම් අපි සිංහලයෝ හැටියට ඒ අයව අමතක කරනවා කියලා ඒකට ජාතිවාදයක් පටලවා ගන්න එක වැරදියි. මම දකින්නේ ලැබිච්ච ප්‍රතිඵලය අනුව හොඳාකාරවම පැහැදිළියි මේ ආකාරයට දකුණේ සිංහලයෝ ටිකවත් නැගිට්ටේ නැත්නම් දෙවියන්ගේම පිහිටයි අපේ සිංහල ජාතියට. ඇයි ඒක හිතන්නේ නැත්තේ. සිංහල ලේ ඇගේ තියෙනවා නම්, සිංහලකම ඇගේ තියෙනවා නම් මේ කතා කියන්න එපා. ඒක බොහොම ගෞරවයෙන් ඉල්ලනවා. නිහතමානීව අපි සතුටු වෙනවා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ආරක්ෂක ලේකම් හැටියට, හමුදා සේවයේ නියුතු පුද්ගලයෙක් හැටියට, මට බොහොම සතුටක් තියෙනවා. මේක බුදුදහම තියෙන සිංහල බෞද්ධ රටක්. මංගල සමරවීර මොකද කිවුවේ. එයත් සිංහලයෙක්. එයත් බුදුදහම අදහන කෙනෙක්. ඉතිං එහෙම වුණාහම අපි ඒ අයට ඔළුව නවන් ඉන්නද කියන්නේ. ඒ නිසා කෙසේ මොනවා කිවුවත් මම දකිනවා සජිත් මහත්තයා හොඳ මහත්තයෙක් තමයි. එතුමා මොන තරම් නිවාස හැදුවද, මොන තරම් ගෙවල් දුන්නද කියලා එතුමාම කියනවා. ඇයි ඒක මිස් වුණේ. ඒ අතරේ හිටියා නොයෙකුත් මත දරණ අය. නිවාස හැදුවට හොඳ දේවල් කරාට මිනිස්සුන්ට දෙන්න දෙයක් වුණේ නෑ පහුගිය ආණ්ඩුවෙන්. ඒ නිසා කිසි දෙයක් දැන් කතා කරලා වැඩක් නෑ. ඔබ තේරුම් ගන්න ඔබ කළ දේ හරිද කියලා. තමන් තමන්ගේ හදවතට තට්ටු කරලා බලන්න, අහන්න ඔබ කියපු දේ හරිද කියලා. සමාජ ගත වුණ දේ හරිද කියලා ඔබම තේරුම් ගන්න. හදවතට තට්ටු කරලා අහන්න ගත වෙච්ච පහුගිය මාස කීපය තුළ තමන් කරපු දේ හරිද කියලා. ඒ ඇති හොඳටම. තමන්ගේ හෘද සාක්ෂියට එකඟව වැඩ කරා නම් බුදු දහම අනුව තමන්ට දිට්ඨධම්මවේදනීය කර්ම ඵල දෙන්නේ නෑ. තමන් හොඳ දෙයක් කරානම් හොඳ දේ ලැබෙනවා. වැරදි දෙයක් කළානම් වැරදි දෙයක් ලැබෙනවා. එච්චරයි මගේ මතය. මේ සඳහා ඇප කැප වුණ සියලුම ජනතාවට, විශේෂයෙන්ම බෝපෙ පෝද්දල ජනතාවට, මා නියෝජනය කරන පෝද්දල කොට්ඨාශයේ සියලුම ජනතාවට හදපිරි ප්‍රණාමය පුද කරනවා. සිංහල ජාතියක් හැටියට අනිත් අයගේ අදහස් එකතු කරගෙන මේ නිවැරදි තීන්දුව ගත්තට සියලුම ජනතාවට ස්තූතිය පුද කරන ගමන්ම සියලු මන්ත්‍රීවරුන්ටත් ස්තූතිය පුද කරනවා. හැම දෙනාටම සුභ අනාගතයක්.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ප්‍රථමයෙන්ම අපේ රටේ හත්වන විධායක ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට මගේත්, නරාවල කොට්ඨාශයේ ජනතාවගේත් සුභාශිංසන තිළිණ කරනවා. තරුණ මන්ත්‍රීවරයෙක් විදියට මම දුටුවා මැතිවරණය තුළ තරුණයන්, සමස්ථ රටේ තරුණයන් ඉල්ලා සිටියා පාර්ලිමේන්තුවේ 225 නියෝජනය නොකරන හොඳ ශක්තිමත් නායකයෙක්, රටට ආදරය කරන නායකයෙක් ඉදිරිපත් කරන්න කියලා. එක්සත් ජාතික පක්ෂය සඳහන් කළ විදියට වයසක අපේක්ෂකයෙකුයි, අවුරුදු 52 ක තරුණ නායකයෙකුයි ඉදිරිපත් වුණා. හැබැයි අර වයසක මනුස්සයව තමයි රටේ තරුණයෝ තෝරා ගත්තේ මේ සැරේ රටේ ජනාධිපති විදියට තෝරාපත්කර ගන්න ඕන කියලා. රටට ආදරය කරන්නේ එතුමා නිසා ලක්ෂ 69 ක ජනතාවගේ ඡන්දයෙන් එතුමන්ව ජයග්‍රහණය කරවලා රටේ සුරක්ෂිතභාවය ඇති කළා. මම හිතන්නේ මේ ජයග්‍රහණය සමග නැවතත් අපිට ජාතිවාදය කියන වචනය කතා කරන්න අවශ්‍යතාවය ඇති නොවේවි කියලා. ඒ සියල්ල නිරාකරණය කරමින් මේ රට සුරක්ෂිත මාවතකට රැගෙන යන්න එතුමන්ට හැකියාව තියෙනවා. නිවැරදි දැක්මක් තියෙනවා. අපි දැක්කා ඒක පළමුවෙන්ම ජාතිය අමතපු වෙලාව තුළ. එතුමන් ජනප්‍රිය වචන ඉදිරිපත් කරේ නැ. ඊළඟ මැතිවරණය ඉලක්ක කරගෙන සිංහල, දෙමළ ඡන්ද රැකගන්න උත්සාහ කරේ නැ. ඒ නිසා හොඳ දක්ෂ නායකයෙක් කියන කාරණාව අපි සිහිපත් කරනවා. ඒ වගේම තමයි මීට කලින් කතා කරපු කියාස් මන්ත්‍රීතුමා සඳහන් කරා එතුමන්ලාගේ පාලන කාලය තුළ කොමිෂන් සභා ඇති කරලා මේ රට නිවැරදි දිශාවකට ගෙනියන්න උත්සාහ කරා කියලා. අපි සඳහන් කරනවා ඔබතුමන්ලා ඇති කරපු මැතිවරණ කොමිෂන් සභාව තුළින් මේ රටේ ජනතාවට මැතිවරණ ලබා ගන්න ඒකාබද්ධ විපක්ෂයේ අපි කොතෙක් දුරට කටයුතු කරාද කියලා. ඔබතුමන්ලා අපිට, මේ රටේ ජනතාවට මැතිවරණයක්වත් ලබා දුන්නේ නැ ජනතාවගේ පරමාධිපත්‍ය බලය වෙනුවෙන්. ඒ වගේම තමයි උද්ඝෝෂණ කරා කිව්වා. කකුලෙන් ඇද්දා කිව්වා. උද්ඝෝෂණ කරන්න වෙනවා රට හරියට යන්නේ නැති වුණාට පස්සේ. රටේ මිනිස්සුන්ට අවශ්‍ය දේවල් නොලැබෙන කොට උද්ඝෝෂණ කරන්න වෙනවා. ඒවා කවුරුවත් ඇති කරන්න අවශ්‍යතාවය නැ. ඒවා ඉබේම සිදු වෙනවා රට හරියට පාලනය නොකරන කොට. ඒ වගේම තමයි පෝස්ටර් ව්‍යාපාරය ගැන සඳහන් කරා. ඔබතුමන්ලාගේ රජය තමයි ඒ පෝස්ටර් අලවන එක තහනම් කරන්න ක්‍රියාමාර්ග ගත්තේ. හැබැයි ඒක කරේ පළාත් පාලන මැතිවරණය වෙලාවේදී. පළාත් පාලන මැතිවරණය වෙලාවේදී අපි දැක්කා විශාල වශයෙන් පෝස්ටර් අලවනවා. මේ හැමතැනම ඇලෙව්වා. අපිත් ඇලෙව්වා. මට ආධාර කරපු සහෝදරයන් දෙදෙනෙකු උසාවි අරන් ගියා පොලිසියෙන් අල්ලලා පෝස්ටර් අලවන කොට. හැබැයි ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මැතිවරණය තුළ ප්‍රතිපත්තියක් විදියට පෝස්ටර් ඇලෙව්වේ නැ. පෝස්ටර් අලවන්නේ නැ කියන මතයේ හිටියා. ඒක ආදර්ශයට අරන් තමයි අනෙකුත් අපේක්ෂකයෝ ඒ කටයුත්ත කරේ කියන එක සිහිපත් කරනවා. ඒ ගෞරවය ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට හිමිවෙන්න ඕන කියන කාරණාව සිහිපත් කරනවා. ඒ වගේම ලංකාවේ ප්‍රථම වතාවට දේශපාලනය නොකරපු, රාජ්‍ය නිලධාරියෙක් රටේ ජනාධිපතිධූරයට පත් වුණා. මම හිතන්නේ ඒ රාජ්‍ය නිලධාරියෙක් විදියට ඒ ලැබුණ අත්දැකීම දේශපාලඥයෝ දිහා පැත්තකින් ඉඳන් බලා ඉඳලා රට පාලනය කරන්න අවශ්‍ය දැනුම හොඳාකාරව තියෙන නායකයෙක් විදියට පරිණත වෙලා තියෙනවා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා. බෞද්ධ සිංහල ජනතාව එතුමාව බහුතර ඡන්දය ලබාදුන්නා කියලා සඳහන් කරා. බහුතර ඡන්දයෙන් එතුමාට ජයග්‍රහණය කරන්න පුළුවන්කම තිබුණත් ජයග්‍රහණයෙන් පස්සේ සිංහල ජනතාවගේත් මා හට ඡන්දය ලබා නොදුන් දෙමළ ජනතාවගේත්, මුස්ලිම් ජනතාවගේත්, සියලුම ජාතීන්ගේ ජනාධිපතිවරයා විදියට සියලුම ජාතීන්ගේ පුරවැසි අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටිනවා කියන කාරණය සඳහන් කරා. ඒ වගේම තමයි මම ආසම කරන කාරණයක් එතුමා අන්තිමට සඳහන් කරා. මේ රට වෙනුවෙන්, මේ රටේ ආරක්ෂාව වෙනුවෙන් මේ රට ඉදිරියට අරන් යන්න එතුමාට තියෙන විධායක බලතල පාවිච්චි කරන්න පසුබට වෙන්නේ නැ කියන කතාව. එවැනි කොන්ද කෙලින් තියන් වැඩ කටයුතු කරන්න පුළුවන් නායකයෙක් මෑතකාලයේදී අපිට හිමිවුණානේ කියලා හිතෙනවා. මොකද ඒ තරම් ජ්‍යෙෂ්ඨ, පරිණතභාවයක් තියෙන හොඳ නායකයෙක් තමයි අපි තෝරා පත්කරගෙන තියෙන්නේ. ඒ වගේම තමයි මඩ ප්‍රචාර විශාල වශයෙන් එතුමාට එල්ල කරා. අපි කිව්වා මඩ ගහන්න, මඩ ගහන කොට තමයි නෙළුම පිපෙන්නේ. නෙළුම පිපිලා තියෙනවා අද මඩ වලින් ඉහළට ඇවිල්ලා. මේ ප්‍රාදේශීය සභාවේ ඉන්න මන්ත්‍රීවරියකුත් අපි දැක්කා සමාජ මාධ්‍ය ජාල හරහා විශාල වශයෙන් මඩ ගැහුවා. බොරු චෝදනා නැගුවා. හැබැයි අද ඒ මන්ත්‍රීතුමියට ඒක ආවාටයක් වෙලා තියෙනවා අපි දැක්කා ආපස්සට කැරකිලා. ඒ මන්ත්‍රීතුමියගේ චරිතය අපි අද හොඳට දැන ගත්තා. ඒ මඩ ප්‍රචාර එල්ල වෙන කොට ඒ මඩ නැවතත් ඒ අයට වැදිලා තියෙනවා. සමාජ මාධ්‍ය ජාල හරහා හොඳට දැක්කා. තමන් ගල් ගහන කොට තමන් වීදුරු ගෙවල් වල ඉඳන් ගල් ගහන්න එපා කියන කාරණාව මම කියනවා. වීදුරු ගෙවල්වල ඉඳන් ගල් ගහන කොට තමන්ගේ හෙලුව අනිත් අයට පේනවා. ගල් ගහන කොට ඒ පැත්ත බලනවා වැඩියි. වීදුරු ගෙදර නිසා පේනවා වැඩියි. එවැනි කටයුතු කරන්න එපා කියන ඉල්ලීම කරනවා. මොකද කවුරු නායකයා වුණත් සජිත් ප්‍රේමදාස වේවා, ගෝඨාභය රාජපක්ෂ වේවා, මහින්ද රාජපක්ෂ වේවා, ඕනෑම නායකයෙකුට, මේ ප්‍රාදේශීය සභාවේ ඉන්න මන්ත්‍රීවරයෙකුට වේවා අපේක්ෂකත්වය දරණ කොට ඒ අයට මඩ ගහන්න එපා. එවැනි ප්‍රචාරණ කටයුතු සිදු කරන්න එපා

කියන ඉල්ලීම කරනවා. ඒ වගේම තමයි ගරු මන්ත්‍රීවරුනි මේ රට නැවත සුරක්ෂිත රටක් බවට පත් වෙන, අර එක්සත් ජාතික පක්ෂය වචන වලට පමණක් සීමා කරපු ඉන්න හිතෙන රටක් දැන් තමයි ඇති වෙන්න ඇවිත් තියෙන්නේ. දැන් තමයි ඉන්න හිතෙන රටක් තියෙන්නේ. මොකද අපිට විදෙස් මාධ්‍ය ඔස්සේ විදෙස් නායකයන් සඳහන් කරන කාරණා ගත්තට පස්සේ, කොටස් වෙළඳපොළ අපි දැක්කා සීඝ්‍ර වර්ධනයක් ඇති වෙලා තියෙනවා මැතිවරණයෙන් පසු දින. ආයෝජනයන් සඳහා විදේශිකයෝ ආයෙත් එන්න පටන් අරගෙන තියෙනවා. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ යුගය වගේ සංවර්ධන යුගයක් කරා රට නැවත රැගෙන යන්න පුළුවන් කියන අනාවැකිය බොහොම පැහැදිලිව පේනවා. මගේ රටට මම ආදරෙයි. මගේ රට තවත් බැබළෙන්න, සුරක්ෂිත රටක් බවට පත් වෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා. ඒ දේ කරන කොට ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට සහාය, ශක්තිය ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රිනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය ඃ-** ඇත්තටම බොහෝ දේ මටත් කිවයුතුව තිබුණත් ඒ සියලු දේ මගේ මන්ත්‍රීවරු අතින් කියවුණා. මට පුංචි වචනයක් කියන්න තියෙනවා මේ අවස්ථාවේදී. බෝපෙ පෝද්දල, උළුවිටිකේ ජනතාව වෙනුවෙන් මම හත්වන විධායක ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට මාගේ උණුසුම් සුභ පැතුම් මේ අවස්ථාවේ ඉදිරිපත් කරනවා. තවද මම ගුරුවරියක් වශයෙන් දැකපු එක දෙයක් තමයි දරුවෝ ඉතාමත්ම බලාපොරොත්තු වුණ දෙයක් තමයි ගෝඨාභය රාජපක්ෂ මැතිඳුන් යටතේ අනාගතය සුරක්ෂිත කර ගන්න. පාසල් කාලයේදී මම ඇත්තටම දැකපු දෙයක් තමයි දරුවෝ ඉතා අනාථ තත්ත්වයකට පත් වුණා පහුගිය කාලයේදී රටේ ඇති වෙච්ච කලබලකාරී තත්ත්වයත් එක්ක. ඔවුන් බලාපොරොත්තු වුණේ අනාගතයේදී අපිට ජීවත් වීමට නිදහස් රටක්. ඒ අනුව ගෝඨාභය රාජපක්ෂ මැතිඳුන් ඉදිරියේදී දරුවන් වෙනුවෙන් සුරක්ෂිත රටක් ඇති කරයි කියන බලාපොරොත්තුව යටතේ මගේ පක්ෂයේ නායකතුමා වුණත් ඊට වැඩිය මට අවශ්‍යතාවය වුණේ මගේ දරුවන්ටත්, රටේ අනිත් අනාගතය බලාගෙන ඉන්න දරුවන්ටත් සුරක්ෂිත රටක් ගොඩනගා ගැනීමටයි. ඒ අවස්ථාව වෙනුවෙන් මමත් මගේ දිවිහිමියෙන් කටයුතු කළා. මගේ දරුවන් පවා පැත්තකට දාලා තමයි මේ ජයග්‍රහණය වෙනුවෙන් කටයුතු කළේ. ඇත්තටම සතුටුයි අද වෙනවිට එතුමා හත්වන විධායක ජනාධිපති ලෙස අභිෂේකලත් මේ අවස්ථාවේදී ඉතාමත් සතුටු වෙනවා අපේ රට සුරක්ෂිතවීම ගැන. ඒ අනුව උළුවිටිකේ ජනතාව වෙනුවෙන් මා මේ අවස්ථාවට මගේ සුභාශිංශන එකතු කරමින් නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මගේ සහෝදර මන්ත්‍රීවරුනි, හත්වන විධායක ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට සුභාශිංශන ගෙන එමින් මේ අවස්ථාවේ කැප වී සිටින සියලුම බෝපෙ පෝද්දල ජනතාව වෙනුවෙන් අවංක ස්තුතිය පුද කරමින් මගේ නායක වෛද්‍ය රමේෂ් පතිරණ මැතිතුමා ඇතුළු සියලු මන්ත්‍රීතුමන්ලාටත්, පළාත් සභා මන්ත්‍රීතුමන්ලාටත් මාගේ ස්තුතිය පුද කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, සෙසු මන්ත්‍රී සහෝදරවරුනි, 2019 නොවැම්බර් 16 වෙනිදා මේ රටේ හත්වන විධායක ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ මැතිවරණය පැවැත්වෙච්ච මොහොතේ මම හිතන්නේ ප්‍රධාන වශයෙන් කඳවුරු තුනක්, ඒ කියන්නේ එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ සන්ධානයකුත්, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ හා ජාතික ජන බලවේගය තේමා කර ගනිපු කඳවුරු තුනක් තරග වැදුණා. ඒකේ බොහොම පැහැදිලිව අපි පිළිගත යුතුව තියෙනවා 52.25% ක ප්‍රතිශතයකින් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ජනාධිපති අපේක්ෂක ගෝඨාභය රාජපක්ෂ මහත්තයා ජයග්‍රහණය කළා. අපි විශ්වාස කරනවා මේ ජයග්‍රහණය එතුමා රටට ගෙනාපු ජයග්‍රහණයක් නම්, 2015 ජනවාරි 08 වෙනිදා මේ රටේ බලයට පත්වුණ මෛත්‍රීපාල සිරිසේන මහත්තයාට ලැබුණ අභියෝගය තමයි පහුගිය රජය තුළ සිදු වෙච්ච වංචා දූෂණ, රට තුළ විනයක් නැති නීතියක් නැති පාලනය නිමාවට පත් කරලා මේ රටට විනයක්, නීතියක් ඇති රටක් නිර්මාණය කිරීම සහ වංචා දූෂණ කරපු සියලු දෙනාටම දඬුවම් දෙනවා කියන පොරොන්දුව මත තමයි 2015 දී මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා මේ රටේ ජනාධිපති වෙන්නේ. හැබැයි අවුරුදු හතරහමාරක් වෙනකම් මම හිතන්නේ නෑ එතුමාට එක හොරෙක්වත් අල්ල ගන්න පුළුවන් වුණා කියලා. මම හිතනවා මම විශ්වාස කරනවා ඒක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හොරු එතුමාව අල්ල ගත්තා ඒකයි වුණේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** හොරු ටික එතුමාව අල්ලාගෙන හිටියා. ඊට පස්සේ එතුමා එක්ක ඉන්න කට්ටියත් හොරකම් කරා. මේ කාරණා ගත්තට පස්සේ මට හිතෙනවා මේ ජනාධිපතිවරයාටත් තියෙනවා වගකීමක් ජනාධිපතිවරයා වෙන්න කලින් මේ රටේ මූලිකව තිබුණ දේ තමයි මගේ සහෝදර මන්ත්‍රීතුමා කිවුවා වගේ විශාලම බලපෑමක් වුණේ මහ බැංකුවට මහ දවල් සිද්ධ වෙච්ච බෙදවාචකය. මම හිතන්නේ මේ බෙදවාචකය රටට හෙළිවන්නේ කෝප් කමිටුවේ අපේ නියෝජනය තිබුණ නිසා. නැත්නම් වෙන නියෝජනයක් මේ කමිටුවේ තිබුණා නම් එළියට එන්නෙම

නෑ. නමුත් ඒ සම්බන්ධව ජනාධිපතිවරයා මේකට කටයුතු කරේ නෑ. එවකට හිටපු ජනාධිපතිවරයා. ඒ වගේම තමයි මේ මෑතකදි මේ රටේ ජීවිත 300 කට විතර වන්දි ගෙවන්න සිද්ධ වෙච්ච අන්තවාදී ප්‍රහාරය. මේ රටේ මියගිය දරුවන්ට හෝ පුද්ගලයන්ට සාධාරණයක් ඉෂ්ඨ වෙන්න නම් මේවගේ පිටිපස්සේ ඉන්නේ කවුද, මේ ප්‍රහාරය සිද්ධ කරේ කවුද, මහ බැංකු සිද්ධිය පිටිපස්සේ ඉන්නේ කවුද කියන එක 16 වෙනිදා බලයට ආපු ගෝඨාභය රාජපක්ෂ මහත්තයාට තියෙන මූලික වගකීම තමයි ඔහු නිවැරදි ජනාධිපති කෙනෙක් නම් වෙන්න ඕන මේ කාරණා සම්බන්ධව මූලිකවම මාස කීපයක් ඇතුළත හෙළි කළ යුතුයි. ඒ වගේම තමයි දැන් මේ කතා කරා උතුරේ ඡන්ද අන්තවාදයට නැත්නම් බෙදුම්වාදයට යටවෙලා වැටුනේ නෑ කියලා. අපි විශ්වාස කරනවා 88 - 89 කාලයට ගියෝතින් අපේ රටට බෙදුම්වාදය එන්නේ මේ පළාත් සභා ක්‍රමය යටතේ. අපේ රට දෙකට බෙදෙන්නේ එතනින්. අපේ රට පළාත් නමයකට කඩලා උතුරු නැගෙනහිර දෙක එකට එකතු කරලා උන්ට වෙනම ඊළාම් රාජ්‍යයක් ඉල්ලන්නේ 88 න් පස්සේ. අපේ ජීවිත හැටදහසක් වන්දි ගෙවන්නේ මේ සටනට. අපි අරගල කරනවා පළවෙනි පළාත් සභා ඡන්දයේදී ඡන්දය ලබා දෙන්න එපා කියලා. අපි ගෝඨාභය මහත්තයාට කියනවා අවුරුද්දයි මාස හයක් වෙනවා මේ රටේ පළාත් සභා නැතුව. රට දිවුවා. එතුමා මේ බෙදුම්වාදයට අකමැති නම් මේ රට බෙදෙන එකට අකමැති නම් එතුමාට තියෙනවා ඊළඟ මැතිවරණයේදී තුනෙන් දෙකක බලයක් අරගෙන මේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කරන්න. ඒක තමයි රටට කරන්න පුළුවන් ලොකුම දේ. ප්‍රාදේශීය සභා මට්ටමින් මේ රට දියුණු කරන්න පුලුවන්. පළාත් සභා කියන්නේ සුදු අලියෙක්. නැවත පාර්ලිමේන්තුවට එන්න තමන්ගේ දරුවට මොන්ටිසෝරියක් තමයි පළාත් සභාව කියන්නේ. සෑහෙන්න මුදලක් රටේ වියදම් වෙන්නේ පළාත් සභාවට. අපි එදත් විරුද්ධයි. අදත් විරුද්ධයි. අපි පැහැදිලිව කියනවා රටට ආදරය කරන නායකයෙක් නම් මේ පළාත් සභා යෝජනා ක්‍රමය, දහතුන්වන ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කරන්න කියලා. ඒ නිසා රට තුළ ලොකු ප්‍රශ්න ගණනාවකට උත්තර දෙන්න එතුමාට අවස්ථාව තියෙනවා. එතුමා ඔබතුමාලා කියන ආකාරයට පරිණත දේශපාලනය නොදන්න නායකයෙක් නම් රාජ්‍ය නිලධාරියෙක් විදියට එතුමාට මේ අත්දැකීම් ඇත්නම්, එතුමාට තියෙනවා මේවාට උත්තර හොයන්න. ඒ වගේම තමයි පෝස්ටර් ව්‍යාපාරය සම්බන්ධයෙන් මේ සභාවේ යම් කතා බහක් ඇති වුණා. අපි කියනවා අපි මැතිවරණය කරන කොට හැම අවුරුද්දකම අපේ පළවෙනි ප්‍රචාරක වැඩේ තමයි පෝස්ටර් ව්‍යාපාරය. අපි ඒක කොහේදිවත් නෑ කියන්නේ නෑ. මොකද මේ රටේ වෙන ඕනෑම දෙයක් ජනතාවට දැනුම් දෙන්න තියෙන ලේසිම ක්‍රමය තමයි පෝස්ටර් ව්‍යාපාරය. අපිට මාධ්‍යය ආයතන නෑ. පහුගිය ජනාධිපතිවරණයේදී අපි දැක්කා මාධ්‍යය හැසිරුන ආකාරය. ඒක මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමත් පෙරේදා ප්‍රකාශයට පත් කරා. ඊළඟ මහ මැතිවරණයේදී පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරු තෝරන එක මාධ්‍යය ආයතනවලට දෙන්න එපා කියලා කිවුවා. ඒක නිසා අපි පැහැදිලිව කියනවා එතුමා විනයගරුක නායකයෙක් නම් මේ මාධ්‍යයට මීට වඩා නීතිරීති ගේන්න. මාධ්‍යය කියන්නේ රටක් වෙනස් කරන්න පුළුවන් තැනක්. විශේෂයෙන්ම සන්නිවේදනය හරහා රටේ ජනතාවට විශාල සේවයක් කරන්න පුළුවන් තැනක් මාධ්‍ය කියන්නේ. පහුගිය කාලේ මාධ්‍යය හැසිරුන හැටි අපි ඉතා පැහැදිලිව දැක්කා. කිසිම මාධ්‍යයකින් අපිට සහයෝගයක් ලැබුණේ නෑ. මාධ්‍යය සහයෝගය ලැබුණේ නෑ කියලා අපි මැතිවරණ ව්‍යාපාරය හැකිලුවේ නෑ. අපි පෝස්ටර් ව්‍යාපාරය මඟින්, ගෙන් ගෙට ගිහින් දැනුවත් කිරීම් මඟින් මේ සියල්ල අපි කරා. අපි ඒ ජනතාවට අදත් කියන්නේ ඔබට හෙටත් බලාගෙන ඉන්න වෙන්නේ අපේ පෝස්ටරය වදිනකම් රටේ ඊළඟ විනාශය මොකක්ද කියන එක. ඒ විනාශය අපි මොන ප්‍රශ්නය ආවත් රටට දැනුවත් කරනවා. ඒ නිසා අපි මේ පත්වෙච්ච ජනාධිපතිවරයාට සුභ පතන ගමන් අපි එතුමාගෙන් බලාපොරොත්තු වෙනවා පහුගිය ගෙවුන අවුරුදු හතරහමාරේ ආණ්ඩුව වගේ නැතුව අඩුම හෝ දශමයකින් හෝ හොඳට ආණ්ඩුවක්, රට පාලනය කරන්න පුළුවන් පාලකයෙක් හැටියට ගොඩනගන්න. එහෙම ගොඩනගන්න බැරි පාලකයෙක්ගේ තත්ත්වයට මේ පාලකයා පත්වුණොත් මේ පාලකයාටත් එරෙහිව අරගල කරන්න අපි සූදානම්. ඒ අරගලයට අපේ රටේ ජනතාවට එකතු වෙන්න කියනවා. ඒ වගේම අද මේ අවස්ථාව ලබා දුන්න ගරු සභාපතිතුමාටත්, ස්තුතිවන්ත වෙමින් අපි බලාපොරොත්තු වෙනවා රට මීට වඩා සුභ දිශාවකට ගමන් කරයි කියලා. ඒක විශ්වාසයක් පමණයි. ඒ විශ්වාසය කඩ නොකරයි කියන විශ්වාසයකුත් තියෙනවා. ඒ නොවුණත් ඊට එරෙහිව අරගල කිරීමේ අයිතියත් අප සතුයි කියමින් මම මගේ කතාව නවත්වනවා. බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** සුභ උදෑසනක් ගරු සභාපතිතුමා ඇතුළු සහෝදර මන්ත්‍රීවරුන්ට හා මන්ත්‍රීවරියන්ට. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හත්වන විධායක ජනාධිපතිධූරයට පත්වුණු අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අක්මීමණ අපේ ජනතාවගේ උණුසුම් සුභ පැතුම් එක් කරනවා. මම කියන්න සූදානම් වෙනවා කරුණු කීපයක්. මම අගය කරන කරුණු කීපයක්. මේ තරුණ මන්ත්‍රීවරු බොහෝ වැදගත් කරුණු ටික කිවුවා. ඒ වගේම ජනතා විමුක්ති පෙරමුණේ සහෝදරයාගේත් ඒ කතාවල සමහර ඒවාට මම ගරු කරනවා මේ පළාත් සභා ක්‍රමය සම්බන්ධව. පහුගිය කාලයේ ඇතිවෙච්ච පාස්කු ප්‍රහාරය, බැඳුම්කර සිද්ධිය, ඒ වගේ බරපතල ගනයේ සිද්ධීන් නිසා ඒ අත්වෙච්ච ඉරණම මේ

ආණ්ඩුවට. මේ නායකයා යටතේ ආණ්ඩුව ඉදිරියට කරගෙන යන්න, පත්වෙච්ච අභිනව ජනාධිපතිතුමාට ධෛර්යය ලැබෙන්න කියලා මම උණුසුම් සුභ පැතුම් මේ වෙලාවේ එක් කරනවා. ඒ වගේම පහුගිය මැතිවරණයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගනිපු තීන්දුවක් එක්ක සමහරු හිතුවා අපි නැහැයි කියලා. විශේෂයෙන්ම බෝපෙ පෝද්දල මේ මන්ත්‍රීවරු ඇතුලු ජනතාව දැනුවත් වෙන්න අවස්ථාවක් කර ගන්නවා මේක. හේතුව අපි කොට්ඨාස දිනපු මන්ත්‍රීවරු නෙමෙයි. අපිත් එක්ක තරග වැදුනා අපේක්ෂකයෝ 26 දෙනෙක්. ඒ 26 දෙනා එකතු කරපු ඒ තරම් අභියෝගාත්මක මැතිවරණයක තමයි අපි බෝපෙ පෝද්දල තරග වැදුනේ. ගමේ හිටිය සභාපති, භාණ්ඩාගාරික, ලේකම් නෑ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ. සභාවේ ඉඳපු මන්ත්‍රීවරු, සභාපතිවරු නෑ, ආසන සංවිධායකවරු නෑ. අන්ත අසරණ විදියට, දරුණුම පීඩනකාරී අවස්ථාවේ, අපේ සංවිධායකවරුන්ට අපේක්ෂකයෝ හොයාගන්න බැරිවුණා. ඒක නිසා ඒ බරපතල අවස්ථාවට මුහුණ දීලා ලක්ෂ 14ක් ඡන්ද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට, බුලත් කොළයට අරන් දුන්නා. ඒ අරන් දුන්න වරම කේවල් කරගෙන තමයි දයාසිරි ජයසේකර මැතිතුමන්ලා කටයුතු කරේ. නමුත් අපිට යුතුකමක් තියෙනවා ඒ සම්මාදම් වුණ ඡන්ද වලින් මන්ත්‍රීධූරය ලබාගෙන ඒ අයගේ පීඩනයක් තිබුණා උඹලා කොහාටද යන්නේ කියන එක. උඹලා එහේ යනවා නම් අපි මෙහේ යනවා. අපිට සිද්ධවුණා ගරු සභාපතිතුමනි, කිසිම අපේක්ෂකයෙක් එක්සත් ජාතික පක්ෂයටවත් ගොඩනොවී රැක ගන්න අපි දරුණු මෙහෙයුමක යෙදුණා. අපි නිහඬව ගෝඨාභය රාජපක්ෂ මහත්තයාගේ ජයග්‍රහණය වළක්වන්නවත්, එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයා පරද්දන්නවත් කටයුතු කරේ නෑ. සමහරවිට ඔයගොල්ලෝ සැක සංකා ඇති කරා. මාත් එක්කත් කතා කරා. මම එක්සත් ජාතික පක්ෂයට ගියා, මුදල් අරගෙන ගියා කිව්වා. ඒක ගැන ඔබතුමන්ලාට තිබුණා නම් සුළුවෙන් හෝ සැකයක්, බියක් ඒක තුරන් කර ගන්න කියන කාරුණික ඉල්ලීමත් කරමින් අපි විරෝධතාවයකින් තොරව නිහතමානීව අපේ අභිමානය රැක ගනිමින් කටයුතු කරා. ඒ නිසා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සහයෝගයත් අරගෙන ජනාධිපතිවුණා. අපේ බලාපොරොත්තුව ඉදිරියේදී ශ්‍රී ලංකාවේ ඔහුගේ ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව කාටවත් යටනොවී, කාගේවත් කොන්දේසි පිළිගන්නේ නැතුව පිළිගන්න ඕන ජනතාවගේ තීන්දුව. ඒ නිසා ඒ අනුව කටයුතු කරමින් රටේ තියෙන දැවෙන ප්‍රශ්න විසඳීමට ධෛර්යය ශක්තිය එකතු කරන්න ඕනෑම වෙලාවක අපි සූදානමින් සිටින බව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා සහ සියලු දෙනාටම, ඒ ජයග්‍රහනය වෙනුවෙන් ඇප කැපවූ සියලු දෙනාටම ස්තුතිය ප්‍රකාශ කරනවා. ඒ වගේම ශ්‍රී ලංකාවේ හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාවත් මේ ජයග්‍රහණය කාටවත් අරන් දෙන්න කටයුතු කරේ නෑ. අපක්ෂපාතීව, නිර්පාක්ෂිකව හිටියා. ඒකට ස්තුතිය මට වඩා හොඳින් මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමා අවසන් ප්‍රතිඵල නිකුත්කරන වෙලාවේ ප්‍රකාශ කරා. ඒකත් මම හිතන්නේ පිරිසිදු ප්‍රතිඵලයක් ලබා ගන්න ශක්තියක් වුණා. ඒ නිසා අවසාන වශයෙන් සමුගෙන ගිය මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාට මගේ උණුසුම් සුභපැතුම් එක්කරනවා ඔහුට. ඉදිරියට මගේ දැක්මක් තියෙනවා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට අනිවාර්යයෙන්, දේශපාලනයේ ඉදිරි ගමනක් යන්න මෛත්‍රීපාල සිරිසේන වගේ මහත්වරු අවිහිංසක ගතිගුණ වලින් පිරිපුන් නායකයන් අවශ්‍යයි. ඒක තමයි අපේ රටට වෙන්න ඕන. හොරකම, දූෂණය පිටු දකින නායකයෝ. ඒ නායකයන් එක්ක තමයි ඉදිරි ගමන සාර්ථක කර ගන්න ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා අත්වැල් බැඳ ගන්න ඕන. ඒ වගේම මේ රාජ්‍ය ලාංඡනය, ආයතන වල තියෙන පින්තූර සම්බන්ධව මගේ ආයතනයෙත් මම අරගල කරලා තියෙනවා. මම කාලයක් තිස්සේ විරෝධතාවය දක්වන එකක් තමයි ජනතා බදු මුදලින් පොඩි ප්ලාස්ටරයක් ගැහුවත්, ඊට වඩා වියදමක් දරලා කටවුට්, බෝඩ් ගහනවා. ඒක හෙලා දැකලා අපි කටයුතු කරා. ඒක නිසා ගෝඨාභය රාජපක්ෂ මහතා ඒ ගනිපු තීන්දුව ක්‍රියාත්මක කරන්න අපි උපරිමයෙන් සහයෝගය ලබා දෙනවා. අනිත් එක තමයි අද ඔබතුමා බොහොම වැදගත් විදියට මේ සභාව ආරම්භ කරා. ඔබතුමාට වරදින්නේ නෑ. අද ගත්තා වූ මේ පිළිවෙල දිගටම පවත්වාගෙන යන්න. ඔබතුමාට ඕන වෙලාවක අපි ශක්තිය ධෛර්යය දෙනවා. බොහොම වැදගත් විදියට ඔබතුමා අද සභාව ආරම්භ කරා. අපි හිතාගෙන ආවාට වඩා බොහොම සංයමයෙන් මන්ත්‍රීවරුන්ට ගෞරවය තබමින් ඔබ ආරම්භ කරපු පියවර අනුව ඔබතුමාටත් ඉදිරියට යන්න ශක්තිය හිමිවේවා කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. ඔබ සැමට තෙරුවන් සරණයි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඇත්තටම ප්‍රියන්ත මන්ත්‍රීතුමාගේ කතාවට මමත් එකඟවෙනවා. අද ඔබතුමා වෙනදා සභාව ආමන්ත්‍රණය කරනවාට වඩා හාත්පසින්ම වෙනස් ආකාරයකට සභාව ආමන්ත්‍රණය කරේ. මම හිතන්නේ ඉතාම නිහතමානීව අද සභාව කරා. හැම මන්ත්‍රීවරයෙක් එක්කම සුහදව කතාකරමින් සභාව මෙහෙයවපු ආකාරය අති විශිෂ්ඨයි කියන්න ඕන පළමුවෙන්ම. ඔබතුමාට ඒ පිළිබඳව විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා. ඊළඟට මම හිතන්නේ ඡන්ද හැට නව ලක්ෂ විසිහතර දහස් දෙසීය පනස් පහක් ලබා ගනිමින් 52.25%ක ඡන්ද ප්‍රතිඵලයක් ලබා ගනිමින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති ලෙස තේරී පත් වූ ගෝඨාභය රාජපක්ෂ මැතිඳුන්ට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් මගේ ආචාරය නැවත වතාවක් මම පුද කරනවා. මතක් කරන්න ඕන එතුමා ගනිපු තීරණවල මම

හිතන්නේ මෙතනදී ගොඩක් දුරට කියවුණේ රාජ්‍ය ලාංඡනය ගැන පමණයි. මොකද ජනාධිපතිවරයාගේ රුව, මැති ඇමතිවරුන්ගේ රුවවත් ප්‍රදර්ශනය නොකර රාජ්‍ය ලාංඡනය ප්‍රදර්ශනය කරන්න කියන එක විතරයි ඉස්මතු වෙච්ච ප්‍රධාන කාරණාව වුණේ. ඉතින් මම හිතන්නේ ඒකෙදි අපේ බෝපෙ පෝද්දල සභාව ඉදිරියෙන් ඉන්නවා. සියලු දෙනාටම පේනවා ඇති මෙතන රාජ්‍ය ලාංඡනය ප්‍රදර්ශනය කරලා තියෙනවා එතුමා ගනිපු ක්‍රියා මාර්ගයට කලින් ඉඳන්ම අපේ ප්‍රාදේශීය සභාව ගත්තම. ඒ වගේම මතක් කරන්න ඕන ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපතිධූරයට පත්වීමෙන් අනතුරුව ගනිපු වැදගත් ක්‍රියා මාර්ග රාශියක් තියෙනවා. ඒ අතර මංමාවත් නම් කිරීමේදී පහුගිය දවස් වල අපේක්ෂකයන්ගේ, මන්ත්‍රීවරුන්ගේ, ජනාධිපතිගේ රුව සහිතව ප්‍රදර්ශනය කිරීම නැවැත්වූවා. මින් ඉදිරියට මංමාවත් වල නම විතරක් යොදන්න කියලා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා තීරණයක් අරගෙන තියෙනවා. මම හිතන්නේ ඒක ඇත්තටම අගය කළයුතු කර්තව්‍යයක්. තවත් දෙයක් එතුමා ප්‍රකාශ කරා. ජතික ගීය සිංහලෙන් පමණක් ගායනා කරන්න කියන එක. ඒකටත් මගේ ගරුත්වය හිමි වෙනවා. ඒ වගේම පෝස්ටර් ගැන ප්‍රකාශයක් කරලා තියෙනවා. ඒ වගේම ගව ඝාතනයටත් විරුද්ධව ප්‍රකාශ නිකුත් කරලා තියෙනවා. මම හිතන්නේ ගව ඝාතනය තහනම් කිරීමට ක්‍රියාමාර්ග ගනීවි. ඒ වගේම පෝස්ටර් ව්‍යාපාරය, පෝස්ටර් ගහනවා කියන මතයට විරුද්ධව ප්‍රකාශ නිකුත් කරලා තියෙනවා. ඉදිරියේදී පෝස්ටර් වගේ දේවල් තුරන් වේවි. ඒක අගය කළ යුත්තක්. ඒ වගේම තව මෙතනදී මතක් කරන්න ඕන විශේෂයෙන්ම මම හිතන්නේ පහුගිය දවස්වල, මහින්ද රාජපක්ෂ මැතිතුමාටත් වැරදුණේ ජෝතීෂ්‍යවේදීන් ලංකර ගනිපු නිසා. ජෝතීෂ්‍යවේදීන්, අනාවැකිවේදීන් විශේෂ ප්‍රකාශ කරා පහුගිය කාලේ. දිගින් දිගටම ප්‍රකාශකරා රාජයෝග නෑ කියලා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට. ඇත්තටම කියන්න ඕන අර බුදු හාමුදුරුවෝ කිවුවා වගේ තරු නැකැත්වලට මූලිකත්වය දීලා ක්‍රියාත්මක වෙන එක තේරුමක් නෑ ඇත්තටම. මොකද ජෝතීෂ්‍යවේදීන්, අනාවැකිවේදීන් කියන දේ පිළිගන්න ගියොත් අපේ ගමන අපිට කවදාවත් යන්න ලැබෙන්නේ නෑ. ඒ නිසා ස්ව උත්සාහයෙන් තමන්ගේ ගමන යන්න. ඇත්තටම ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා දුන්න ආදර්ශය උතුම් කියලා මේ අවස්ථාවේ මම මතක් කරන්න ඕන. ඒ වගේම අපේ හිටපු ජනාධිපති අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ තික්ම යාම, ඒ වගේම එතුමා අවසාන වශයෙන් තීරණය කරා පක්ෂයෙන් කිසිම අපේක්ෂකයෙක් නොදා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට සහයෝගය දෙන්න. එතුමාගේ ඒ දූරදර්ශී ක්‍රියාව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් මම අගය කරනවා. ඒ වගේම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් මේ මැතිවරණයේදී විශාල කැපකිරීමක් කරපු දයාසිරි ජයසේකර මැතිතුමා, ඒ වගේම ෂාන් විජයලාල් මැතිතුමා මම විශේෂයෙන්ම සිහිපත් කරනවා. ඒ වගේම අක්මීමණ ආසනයේ ශ්‍රී ලංකා නිදහස් පක්යේ නව සංවිධායකවරයා වශයෙන් පත්වුණ අනිල් ප්‍රියදර්ශන මැතිතුමාටත් මාගේ උණුසුම් සුභපැතුම් මේ අවස්ථාවේදී පිරිනමනවා. ඒ වගේම මැතිවරණයේදී මම දැකපු දෙයක් තමයි ජයග්‍රහකයා ජයග්‍රහණයෙන් උදම් වුණෙත් නෑ. පරාජිතයා පරාජයෙන් පළා ගියෙත් නෑ. දෙන්නම දෙන්නට සුභ පතා ගත්තා. ඇත්තටම මෙරට තිබුණ වෛරී දේශපාලනයට තිත තබමින් ඔවුන් පැවැත්වූ ඒ ක්‍රියාමාර්ගය ඇත්තටම අපි අගය කරන්න ඕන. ඒ නිසා බොහොම සාමකාමී මැතිවරණයක් පැවැත්වූවා. මම හිතන්නේ පක්ෂ පාට සියලු දෙනා ගහ මරාගත්තත් දරුණු ලෙස කිසිම දෙයක්. අපරාධ කටයුත්තක් සිදුවුණේ නෑ. ඒක හින්දා බොහොම සාමකාමී මැතිවරණයක් පැවැත්වීම ගැන සියලු දෙනාට ස්තුතිවන්ත වෙනවා. මම හිතන්නේ සියලු දෙනාටම සුභාශිංශය කරමින් රටට එක්සත්ව, එක්සිත්ව දීර්ඝ ගමනක් යාමට ශක්තිය ධෛර්යය ලැබේවායි කියමින් මම නිහඬ වෙනවා. ඒ වගේම මතක් කරනවා අවසාන වශයෙන් මේ හොරුන් එකතු කර ගත්තොත් මේ ගමන ඉදිරියේදී යාමට ගොඩක් කඩතොළු සහිත බාධාවන් ඇතිවෙන්න පුළුවන්. ඒ නිසා ඒ හොරුන්ගෙන් තොරව මේ දේශපාලන ගමන ඉතා සාර්ථකව යන්න ගෝඨාභය රාපක්ෂ මැතිතුමාට ශක්තිය ධෛර්යය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රිනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය ඃ-** ගරු සභාපතිතුමනි, අභිනවයෙන් තේරී පත්වූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ හත්වන විධායක ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට මම ප්‍රථමයෙන් මාගේ උණුසුම් සුභ පැතුම් පිළිගන්වන්න කැමතියි. මම දෙවනුව කියන්න කැමතියි දැන් මෙවර මැතිවරණය ඉතාම සාමකාමී විදියට පැවැත්වුණා. ඉතින් ඒ සාමකාමී විදියට මේ මැතිවරණය පැවැත්වීමට කටයුතු කරන්න උදව් උපකාර කරපු සියලුම දෙනාටත් මම ස්තුතිය පුදකරනවා. ඒ වගේම තමයි අපේ අභිනවයෙන් තේරී පත්වූ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා ඇතුළු ඉදිරියේදී තේරී පත්වීමට නියමිත කැබිනට් මණ්ඩලයට මම ඉතා ගෞරවයෙන් කියන්න කැමතියි අර කියමනක් තියෙනවානේ හොරා හොරාගේ අම්මාගෙන් පේන අහනවා කියලා. ඉතින් ඒ වගේ නැතුව මේ මෑතකදී සිදුවුණ පාස්කු ප්‍රහාරයේ මහ මොළකරු ඇතුළු ඒ සියලු ඝාතනවලට වගකියන්න ඕන සියලුම ඝාතකකරුවන් වගේම අර ශ්‍රී පාදේ සාන්ටාරය හොරකම් කරා කියන අයවත් ඇතුලත්ව සියලුම දෙනා වහාම අත්අඩංගුවට ගන්න කටයුතු කරන්න ශක්තිය ධෛර්යය ලැබේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** ගරු සභාපතිතුමා ඇතුලු සියලුම මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. මම මේ අවස්ථාවේ කියා සිටින්නේ ඇත්තටම අපගේ අභිනවයෙන් තේරී පත්වූ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාට අපේ සුභාශිංශන මේ අවස්ථාවේ පිරිනමනවා. ඒ වගේම රටක් ඉදිරියට කිසිම කරදර බාධාවකින් තොරව, රටේ ජනතාවට ප්‍රජාතන්ත්‍රවාදය ඉෂ්ඨ වෙන විදියට වැඩ කටයුතු කෙරෙනවා නම් මොනම රජයකට වුණත් අපහසු නෑ රජය ඉදිරියට ගෙනියන්න. ඒ වගේම අපේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමත් පරාජයට පත් වුණා. ජය පරාජය කාටත් උරුමයි. එක පැත්තක් පරාජයට පත්වුණොත් තව පැත්තක් ජයග්‍රහණය කරනවා. ඒක ස්වාභාව ධර්මයේ හැටි. ඒක කවුරුත් ඉගෙනගෙන රට හොඳ තත්වයට පත්වෙනවා නම් කාට කාටත් හෙට දවස සුභයි කියන එක කියමින් මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** සුභ උදෑසනක් වේවා, ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීතුමන්ලාගෙන් සහ මන්ත්‍රීතුමියන්ලාගෙන් අවසරයි. නව විධායක ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට මේ අවස්ථාවේදී මම ඉතා උණුසුම් සුභ පැතුම් එල කරන අතර අපේ යහපාලන රජය විසින් ඉදිරියට ගෙනගිය ග්‍රාමීය වැඩ කටයුතු කරගෙන යාමට, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමාට ශක්තිය හා ධෛර්යය ඒ අතර ලැබෙන්නත් ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම නව ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ අපේ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා අපේ පක්ෂය වෙනුවෙන් කරපු සේවයට මාගේ ගෞරවණීය ස්තුතිය පුද කරමින් නව රජයට සුභාසිරි පතමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිනවයෙන් තේරී පත්වූ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට මාගේ උණුසුම් සුභපැතුම් ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම මෙම අපේ සහෝදර මන්ත්‍රීවරුන්ගේ කතාවල් වලදී කියවුණා සමහරුන් මේ වේදිකාවල කතා කරන දේවල් සම්බන්ධව. වේදිකාවල්වල කතා කරන දේවල් මේ අවස්ථාවේ මතු කරලා යම් යම් මතවාද ඇති කර ගන්න උත්සහයක් තිබුණා. මම කියන්නේ වේදිකාවල්වල මැතිවරණ කාලයේදී නොයෙකුත් කතන්දර කියනවා. ඒ වේදිකාවල කියන කතන්දර දේශපාලනය කරන අපි  වගේ අයට ඒ තරම් උචිත නෑ කටයුතු කරගෙන යන කාල වකවාණුව තුල. මොකද මැතිවරණ කාලයේදී දේශපාලන වේදිකාවල යම් යම් දේවල් සන්නිවේදනය වුණාට ඒවා බොහෝ දුරට සත්‍යතාවයෙන් තොරයි. ඒ කාරණය මම කියා සිටිනවා.මම පහුගිය වකවාණුවේ ප්‍රාදේශීය සභාවට මන්ත්‍රීවරයෙක් විදියට පත් වෙන්න කලින් මානව හිමිකම් සංවිධානවල, ඒ වගේම ෆියුචර් ෆයින්ඩ් සංවිධානයේ, යුධ විරෝධී සංවිධානයේ ගාලු දිස්ත්‍රික් සම්බන්ධීකාරකවරයා විදියට දිගින් දිගටම කටයුතු කරා.මේ මැතිවරණයේදී ඡන්ද නරක සංඛ්‍යාවක් ආවා. ඒක එච්චරටම සුභදායක නැහැයි කියන එක තමයි මගේ හැඟීම. ඒක මගේ පුද්ගලික හැඟීම. මොකද මේ පිළිබඳව අපේ විපක්ෂ නායක කියාස් මන්ත්‍රීතුමා යම් යම් කරුණු මතු කරා. මම අර එක්සත් ජාතික පක්ෂයේ රජය තිබුණ වෙලාවේ තිබුණ සාම ගිවිසුම පැවතුණ වෙලාවේ උතුරට පස් වතාවක් ගියා. ගිහිල්ලා ඒ මිනිස්සු එක්ක, ඒ ජනතාව එක්ක සන්නිවේදනය කර ගත්තා ඔවුන්ගේ නියම තත්වය පිළිබඳව. ඇත්තටම ඒ වෙලාවේ යුද්ධය යන වෙලාව. නමුත් සාමය නිසා අපිට යන්න ඉඩ පහසුකම් ලැබුණට ඒ පළාතේ ජනතාව බොහොම බියෙන් හිටියේ එල්.ටී.ටී.ඊ එක බලය අල්ලයි කියලා. මොකද ඒ මිනිස්සු කැමති නෑ එල්.ටී.ටී.ඊ එකට.  බොහොම අසරණ විදියට ජීවත්වෙන අහිංසක මිනිස්සු කොට්ඨාසයක් තමයි ඒ දෙමළ ජනතාව. ඒ වගේම ඒ මිනිස්සුන්ට සිංහල නායකයන් පිළිබඳව ලොකු සැකයක් තියෙනවා. බරපතල සැකයක්. එයාලා සුළු ජාතියක් විදියට මේ රටේ ජීවත්වෙනකොට එයාලගේ නායකන් විසින් දක්වපු සැලකිල්ල ගැන බලලා එයාලට සැකයි අපේ නායකයෝ අපිට මෙහෙම කරා නම් සිංහල නායකයෝ අපිට කොහොම කරයිද කියලා. මොකද තමුන්නාන්සේලා දන්නවා ඇති කල්පනා කරලා බැලුවොත් ඔය උතුරෙන් දකුණට ආපු ඒ දෙමළ නායකයන් ඒ උතුරේ ඉන්න දෙමළ ජනතාවගේ ඡන්දය අරගෙන කොළඹට ඇවිල්ලා ඊට පස්සේ මොකක්ද අද වෙනකොට වෙලා තියෙන්නේ කියලා. අද මේ වෙනකොට උතුරේ කොණ්ඩ කප කප ඉඳපු කරණවෑමියෝ අද වෙනකොට නැව් පවා තියෙන ලොකු ව්‍යාපාරිකයෝ බවට පත්වෙලා තියෙනවා. ඒ වගේම සුළු රැකියා කරලා උතුරේ ඉඳලා මන්ත්‍රීවරු විදියට ඇවිල්ලා දකුණේ සිංහල සමාජය එක්ක සම්බන්ධ වෙලා ලොකු ධනවතුන් වෙලා තියෙනවා. ඒ උතුරේ ඉන්න ජනතාවට තමන්ගේ නායකයන් ගැනත් විශ්වාසයක් නෑ. මොකක්ද එතනදී මතුවුණා අර යෝජනා 13ක් ගැන. ඒ යෝජනා 13ට සජිත් ප්‍රේමදාස මහතා එකඟ වුණ නිසා ඒ ඡන්දය දුන්නා කියලා කිවුවා. එහෙම එකක් ඇත්තටම එතන වුණේ නෑ. මම බොහොම තදින් නිරීක්ෂණය කරලා බැලුවා මේ මොකක්ද වුණේ කියලා. ඇත්තටම ඒ යෝජනා 13ට එකඟ නොවීම තුල, දෙපාර්ශවයම එකඟ නොවීම තුල උතුරේ ඉන්න දෙමළ පක්ෂ, දෙමළ සන්ධානය විශේෂයෙන්ම ඡන්දය වර්ජනය කරන්න කියන මතයක් හැදුවා උතුරේ ඡන්දය දෙන්න එපා කියලා. ඒ මතය හැදුවට පස්සේ තමයි තැපැල් ඡන්දය තිබුණේ. තැපැල් ඡන්දය 100%ක්ම පාවිච්චි කරා. එයාලා බැලුවා තැපැල් ඡන්දය 100%ක් පාවිච්චි වුණාම නිවේදනයට පස්සේ, එයාලගේ මතයට පස්සේ තැපැල් ඡන්ද මෙහෙම පාවිච්චි වුණා නම් මහ

ඡන්දයත් මෙහෙම වෙයි, එහෙම වුණොත් එයාලට අනාගතයක් නැතිවෙයි කියලා. මෙන්න මේ හේතුව නිසා ඊට පස්සේ තමයි ඔය දෙමළ සන්ධානය සජිත් ප්‍රේමදාස මහත්තයාට සහාය දෙන්න උත්සාහ කරේ. ඔවුන්ට යම් විශ්වාසයක් තියෙන්න ඇති ඔහු ගැන. ඒක නිසා එහෙම වුණේ. දෙමළ ජාතිය බොහොම සැකයි සිංහල නායකයන් පිළිබඳව. බොහොම සැකෙන් තමයි ජීවත් වෙන්නේ. මම කියන්නේ, මම යෝජනා කරන්නේ මෙන්න මේ තත්වයම අපි මුස්ලිම් ජනතාව එක්ක, බෝපෙ පෝද්දල ප්‍රදේශයේ ඉන්න දෙමළ ජනතාව එක්ක මොන ආකාරයට සුහදව ජීවත් වෙනවාද කියන කාරණාව විදියට බලලා ඇත්තටම රටේම ජනතාව ශ්‍රී ලාංකිකයන් විදියට ඉතාම සුහදව ජීවත් වීමට අවශ්‍ය වටපිටාව ඉදිරියේදී සැකසීම අතිගරු ජනාධිපතිතුමා සතුයි කියලා කියනවා. මොකද එතුමාගේ කටින්ම එතුමා කිව්වා මම බලාපොරොත්තු වුණ සහයෝගය ලැබුණේ නෑ කියලා. එතකොට එතුමා කල්පනා කරයි මොවුන්ගේ සහයෝගය ගන්න ඕන නම් මොකක්ද කරන්න ඕන කියලා. මම හිතනවාට වඩා වැඩි දෙයක් ඒ උගත් දේශපාලඥයෝ හිතනවා ඇති. ඒ උදවියට අත්දැකීම් ඇති. ඉදිරියේදී යහපත් පැත්තට මේක හැරෙයි කියලා ලොකු බලාපොරොත්තුවක් තියෙනවා. සියලු දෙනාටම සවන් දුන්නාට ඉතාමත් ස්තුතියි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, මන්ත්‍රීවරියනි, සියලු දෙනාගෙන්ම අවසරයි. නිමාවූ ජනාධිපතිවරණය පැවැත්වූ සමස්ථ කාලසීමාවේදී, එම මැතිවරණ ක්‍රියාදාමයේදී සාමකාමීව, ඉවසීමෙන් කටයුතු කළ මේ රටේ සමස්ථ ජනතාවටම ඇත්ත වශයෙන්ම පුරවැසියෙක් හැටියට සහ මහජන නියෝජිතයෙක් හැටියට අපේ පළමු ස්තුතිය පුද කළ යුතු යැයි මා විශ්වාස කරනවා. මන්ද සාමකාමී මැතිවරණ ක්‍රියාදාමයක් තුලින්ම පමණයි ජයග්‍රහණයක නියම සතුට භක්ති විඳින්න පුළුවන් වෙන්නේ. ඒ නිසා මෑත ඉතිහාසයේදී පැවැත්වුණු සාමකාමීම, සාධාරණ මැතිවරණය තමයි පහුගිය ජනාධිපතිවරණය. එතනදී මේ රටේ ආරක්ෂක හමුදාව, පොලීසිය සහ වෙනත් සිවිල් සංවිධාන කටයුතු කල ආකාරය පිළිබඳව අපේ ප්‍රණාමය නැවතත් ඔවුන්ට පුද කරනවා. ඊළඟට එම මැතිවරණයේදී නිවහල් හා නිදහස් දේශයක් යළි ස්ථාපනය කිරීම සඳහා කිසිදු වරප්‍රසාදයක් භුක්ති විඳීමට බලාපොරොත්තුවෙන් තොරව ඡන්දය දුන් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට සහාය පල කළ ලංකාවාසී සියලුම ජනතාවට මාගේ ගෞරවණීය ප්‍රණාමය මේ අවස්ථාවේදී පුද කරන්න කැමතියි. ඇත්ත වශයෙන් ඡන්දය ගණන් කරන ස්ථානයට අපි සහභාගීවුණා. ඒ වෙලාවේදී ඡන්දය ගණන් කිරීම කෙරීගෙන යද්දී මම අවංකවම ඇතිවුණේ කණගාටුවක්. මන්ද ඡන්ද වල 10කට 2ක් 3ක් පමණයි විරුද්ධ ඡන්ද ප්‍රකාශවෙලා තිබුණේ. එතකොට මම කල්පනා කරා මේ රටේ මිනිස්සු කුමන බලාපොරොත්තුව ඇතිවද, කුමන හේතුව ඇතිවද මේ විදියට ඡන්දය ප්‍රකාශ කරලා තියෙන්නේ කියලා. මිනිස්සුන්ට තිබුණ දැඩි පීඩනය, පැවති රජය පිළිබඳව තිබුණ දැඩි අප්‍රසාදය, මේ රට ගැන තිබුණ දැඩි ආදරය නිසා ජනතාව කිසිදු වරප්‍රසාදයක් බලාපොරොත්තු නැතිව ඔවුන් ස්වකීය කැමැත්තෙන්ම ඡන්දය ප්‍රකාශ කරා. ඡන්ද මධ්‍යස්ථානවල ඡන්දය වැටීමේ ප්‍රතිශතය බැලුවම මෑත ඉතිහාසයේ ඉතාම ඉහල ප්‍රතිශතයක් මිනිස්සු හැමෝම ඡන්දය ලබා දුන්නා. අපට මේ අවස්ථාවේදී වගකීමක් පැවරෙනවා ඇත්ත වශයෙන්ම. තමුන්නාන්සේලා අපි සියලු දෙනාම දන්නවා රජයක් තිබුණ වෙලාවේ සභාපතිතුමා කිව්වා වගේ ප්‍රාදේශීය සභාවේ බලය අපිට ලැබුණා. රජයක් තමන්ට තියෙන අවස්ථාවක ප්‍රාදේශීය සභා බලය එක්සත් ජාතික පක්ෂයට, ජනතා විමුක්ති පෙරමුණට, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට තිබුණේ නෑ. මන්ත්‍රීධූර 22ම මේ මැතිවරණ ප්‍රතිඵලය නිකුත් වෙනකම් තිබුණේ අංශභාග මන්ත්‍රීධූර විදියට. එක අංශයයි ක්‍රියාත්මක කරන්න පුළුවන්. අනිත් අංශය අක්‍රියයි. රජය තියෙනවා සභාව නෑ. සභාව තියෙනවා රජය නෑ. දැඩි අපහසුතාවයක් භුක්ති විඳින්න අපිට සිදුවුණා. අපිට සම්බන්ධීකරණ කමිටු නියෝජනය පවා පහුගිය රජය අත්තනෝමතිකව අහෝසි කරලා දැම්මා. එතකොට පළාත් සභාව ප්‍රතිපාදන කිසිවක් දුන්නේ නෑ ප්‍රාදේශීය සභාවට. අද ඇත්ත තත්වය සභාවේ සභා වාරයේදී දීමනාව ගෙවන්නවත් මුදලක් නැති බව තමුන්නාන්සේලා මතක තියා ගන්න. රජයක් පත්වෙනකොට සභාවේ දීමනාව ගෙවන්න විදියක් නෑ කියන එක මතක තියා ගන්න. එහෙම තත්වයක් තියෙන්නේ. මහා ආණ්ඩුවෙන් මුදල් එවන්නේ නෑ. ඒක තමයි ඇත්ත තත්වය. ඉතින් මේ සභාවල් මේ මට්ටමෙන් ගොඩ නගන්න ඕන. නමුත් අපි දීර්සව වෙනත් සභාවක් වෙලාවක කතා කරනවා ඒ පිළිබඳව. ඒ මූල්‍ය තත්වය පිළිබඳව ඉතාමත් හොඳ යහපත් ප්‍රතිචාරයක් නව රජයෙන් අපිට ලැබෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. ඒ නිසා අපි මෙම ආණ්ඩු පෙරළියත් සමඟ බෝපෙ පෝද්දල ජනතාවට වඩාත් ඵලදායි සේවාවක් ඉටුකරන්න බලාපොරොත්තු වෙනවා. නමුත් අපි සියලු දෙනාටම ඒ සඳහා සමගිය අවශ්‍යයි. සමගිය අත්‍යාවශ්‍යයි. ඒ නිසා අපි සමගිව මේ ලැබුණු අවස්ථාවෙන් ප්‍රයෝජන ගනිමු කියලා යෝජනා කරනවා. ඒ වගේම අපි විශේෂ ස්තුතියක් පුදකරන්න ඕන මේ අවස්ථාවේදී අපි මේ මැතිවරණයට අවුරුදු තුනකට පමණ පෙර සිට සූදානම් වුණේ. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ අවුරුදු තුනකට පෙර පෙළ ගස්සවලා, සූදානම් කරලා, සියලු දෙනාව එකතු කරලා, සියලු සාකච්ඡා තියලා, උද්ඝෝෂණ කරලා එහෙම තමයි. එහෙම නැතිවෙන්න බෑ. කට වහන් හිටියා නම් පහුගිය රජයෙන් වෙන දේ බලාගන්න තිබුණා. ඉතින් එහෙම කරලා මහා සංසරත්නය ඉතා උනන්දුවෙන් කටයුතු කරලා මේ තත්වයට එන්න දීර්ඝ කාලයක් අපි සැලසුම් සකස් කරලා ලබපු ප්‍රතිඵලයක් තමයි

මේ ජයග්‍රහණය. ඒ නිසා අපිට ඒ ජයග්‍රහණය රැක ගැනීමේ දැඩි අවශ්‍යතාවයක් තියෙනවා. අපි විශ්වාස කරනවා නව ජනාධිපතිතුමා අභීතව, එඩිතරව තමන්ගේ කාර්යයභාරය ඉතා හොඳින් ඉටු කරයි කියලා අපිට දැඩි විශ්වාසයක් තියෙනවා. ඒ වගේම අපි මේ අවස්ථාවේදී ස්තුතිය පුද කරන්න ඕන අපේ පක්ෂයේ ජාතික සංවිධායක හිටපු අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමාට. එතුමා මේ මෙහෙයුම සම්පූර්ණයෙන්ම භාර අරගෙන නිවැරදි ඉලක්කය සඳහා මැතිවරණය මෙහෙයවෙව්වා. එතුමාට අපි ස්තුති කරන්න ඕන මේ රටේ ජනතාව හැටියට. ඊළඟට අපි ස්තුති කරන්න ඕන අපේ හිටපු ජනාධිපති, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට. එතුමා නිහඬව සිටීම පිළිබඳව අපේ ගෞරවණීය ස්තුතිය ප්‍රකාශ කරන්න ඕන. එතුමා නිහඬව සිටියා. ඒක අපිට සහයෝගයක් නොවුණත් එතුමා ජනාධිපතිවරයා හැටියට පක්ෂග්‍රාහී නොවී නිහඬව සිටීම අපිට මේ මැතිවරණයේදී උදව්වක් වුණා. ඒ වගේම කතාව නිමා කරන්න පෙර කරුණු දෙකක් තමුන්නාන්සේලාට මතක් කරන්න කැමතියි. මේ සභාව පිහිටුවාගෙන කරපු පළවෙනි සභාවේ මංගල කතාවේදීම මම තමුන්නාන්සේලාට ප්‍රකාශ කරා කවි පදයක්. ඒ කවි පදයෙන් අපි ප්‍රාර්ථනා කරා "මුළු රුහුණම රජ ඉසුරෙන් පිරීයන් කියලා". නැවතත් රුහුණේ නායකයෙක් මේ රටේ නායකත්වයට, මේ රටේ භාරකාරීත්වය ලැබිලා තියෙනවා. ඒ ප්‍රාර්ථනය අපි සිතූ පරිද්දෙන් ඉටුවෙලා තියෙනවා. ඒ වගේම අපි විශ්වාස කරනවා ගාල්ල දිස්ත්‍රික්කයේ ජනතාවට රිචඩ් පතිරණ අමාත්‍යතුමාගෙන් පසු නිසි වැඩපිළිවෙලක් ඇති අමාත්‍යවරයෙක් ලැබුණේ නෑ. අපි විශ්වාස කරනවා තව සතියකට පෙර ඉක්මන් දවසක ගාල්ල දිස්ත්‍රික්කයේ ජනතාවට බලාපොරොත්තු තැබිය හැකි අමාත්‍යවරයෙක් හැටියට ගරු රමේෂ් පතිරණ මැතිතුමා පත්වෙයි කියලා. එතුමත් සමඟ මේ රටේ, දිස්ත්‍රික්කයේ සමස්ථ ජනතාවට ශක්තිය, ධෛර්යය දෙන්නට, ඒ ජනතාවගේ ගැටළු විසඳන්නට තමුන්නාන්සේලා සියලු දෙනාගේම සහයෝගය බලාපොරොත්තු වෙනවා. ඔබ සැමට සුභ අනාගතයක් උදාවේවා කියලා ප්‍රාර්ථනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, ලේකම්තුමා ඇතුළු මාගේ හිතවත් මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. සියලුම දෙනා සුභාශිංසන ගෙනාවා හැම දෙනාම එක දේ තමයි කිවුවේ. නමුත් මම බලාපොරොත්තු වෙන්නේ කියන දේ කරන, කරන දේ කියන හත්වන විධායක ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට අපගේ බෝපෙ පෝද්දල ජනතාවගේ හා මගේ කලේගාන කොට්ඨාශයේ ජනතාවගේ සුභාශිංසන ගෙන ඒමටයි. අපිට, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවට, අපේ කොට්ඨාශ වලට යම් කිසි සංවර්ධන වැඩකටයුතු සිදු කිරීමට බාධාවන් ඇති වෙලා තිබුණා. ඒ බාධාවන් නිරාකරණය කරමින් අපිට, අපේ කොට්ඨාශ වලට සුභ කාලයක් උදා වේවා කියලා ප්‍රාර්ථනා කරන ගමන් මගේ කොට්ඨාශයේ සියලු දෙනාගේ සුභාශිංසන එකතු කරමින් ඔබ සියලු දෙනාටම සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

( ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය. )

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමියකගේ කතාව මගඇරුණා. රංගනී මන්ත්‍රීතුමිය ඔබතුමිය කතාව කරනවද දන්නේ නෑ.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම හිතන්නේ අපේ චන්ද්‍රකුමාර ගරු මන්ත්‍රීතුමාට පොඩි පටලැවිල්ලක් තියෙන්නේ. එහෙම එකක් කියවුණා ඔබතුමා කියපු දෙයින් ගම්‍ය වෙන්නේ වෙන දෙයක් නෙමෙයි මේ සභාව අද වැටිලා තියෙනවා. අපිට රජය නැති නිසා මුදල් නැති වීමෙන් මන්ත්‍රීවරුන්ගේ දීමනාවවත් දීගන්න බැරි වෙලා තියෙනවා කියලා. ඇත්තටම ඒක වෙලා තියෙන්නේ මෙහෙමයි. මීට කලින් ගරු සභාපතිතුමනි, ඔබතුමා ඉඳපු සභා දෙකක් තිබුණා. අපි දිගටම ඒකේ හිටියා. මේ ඉන්න හැම සභාවකම සභාව තියෙන්නේ කවදද 23 වෙනිදා වෙනකම්, 25 වෙනිදා වෙනකම් හිටියේ නෑ දීමනාව ගෙව්වා. මූල්‍ය පරිපාලනයේ තිබුණ වරද නිසා ඒක වුණේ. ඔබතුමා දන්නවා අපි එක්තරා කාලයක වැඩි පොලිය දෙන්නේ කොතනද කියලා හොයලා ගිහිල්ලා, කැන්වස් කරලා ගිහිල්ලා ෆික්ස්ඩ් ඩිපොසිට් දැම්මා. අද ඒ මූල්‍ය පරිපාලනය මොකක්වත් නෑ. ඒක ඉවර කරලා. ඔබතුමා නෙමෙයි මූල්‍ය පරිපාලනයේ සම්පූර්ණ වගකීම ලේකම්තුමා භාරගන්න ඕන. අද වෙනකොට බල්ලට වැටිලා තියෙන්නේ මේක. මේක තමයි ඇත්ත. එක දිගටම ගරු සභාපතිතුමනි, මේක ඔබතුමා නෙමෙයි මේවා දාලා ඉස්සෙල්ලා දැනුම් දෙන්න ඕන. අද හිගන තත්ත්වයට වැටිලා තියෙනවා. අද නිකං ගත්තොත් අර තියෙන තාප්පය හදා ගන්න බැරි වුණා මෙච්චර කල්. ඒ කාලේ අපි බිල්ඩින් ගහන කොට කිවුවා. මේකයි ඇත්ත තත්ත්වය. වෙන දේකින් වෙච්ච දෙයක් නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා මම අද ලොකුවට ඔය ගැන කතා කරන්න බලාපොරොත්තු වෙන්නේ නෑ. මම අද හොඳ මානසිකත්වයකින් ආවේ. මම මේක දිගටම තියාගන්නවා, මේ මානසිකත්වය. නමුත් අබේසේකර මන්ත්‍රීතුමා මම මේකේ වැරැද්දක් වෙනවා නම් මේ කාගේවත් පිට කොයි වෙලාවකවත් පවරන්න කටයුතු කරන්නේ නෑ. ඒ වැරැද්දේ මමත් කොටස්කරුවෙක් කියන එක මම හිරිකිතයක් නැතුව කියනවා. නමුත් අපිට තියෙන ගැටළුව තමයි චන්ද්‍රකුමාර මැතිතුමා සඳහන් කරපු කාරණය. අපිට මුදල් තියෙනවා. මම අද තියෙන මුදල් ගාණ කියන්නේ නෑ. නමුත් අපිට ලැබෙන්න ඕන මුදල් ප්‍රමාණය ලැබෙන්නේ නෑ. එතනයි ගැටළුව තියෙන්නේ. මෙතුමාට පාලනය කරන්න පුළුවන් සීමාවක් තියෙනවා. සංවර්ධන කටයුතු අපි කරනකොට, අනිත් තෙල් බිල් වලට ගෙවන්න ගියාම, මම මෙතුමාගේ පිට චෝදනාව දාන්නේ නෑ. ඒක වැරදියි අබේසේකර මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා කියන්න මේ දේවල් වලදී ප්‍රමුඛතාවය දෙන්න ඕන මේ බිල්ඩින් හදන එකටද, සභාව අරාක්ෂා කරන්න තියෙන තාප්පය හදන එකටද?

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා මට කියන්නකෝ, මේකේ අත්‍යාවශ්‍ය වියදම් තියෙනවා නම්, මේක අනවශ්‍ය මාතෘකාවක් හැබැයි. ඒකනේ වෙන්න ඕන. මේකේ මුදල් ප්‍රමාණයක් නැත්නම්, මොකක් හරි දෙයක් වෙන්න එපැයි. කාටහරි චෝදනාවක් කරනවා නම්, මේකේ මොකක් හරි අක්‍රමිකතාවයක් වෙන්න ඕන. කළයුතු කාරණා වලට ප්‍රමුඛත්වය නොදී වෙනත් කාරණා කරලා තියෙන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් ඔබතුමා බලන්න නිකන් ගත්තොත් ගරු සභාපතිතුමනි, දැන් කර්මාන්ත කරන්න ඕන අපි. අපි වෙනදා කරේ මුදල් තියෙනවානම් විතරයි. එහෙම නැතුව කර්මාන්ත කරලා නෑ. ගෙවන්න සල්ලි තියෙනවා නම් තමයි කරේ. මෙහේ මුදල් තියෙනවානම් තමයි කරේ. කර්මාන්ත කරා. හැබැයි ප්‍රමුඛතාවය දීපු විදිය වැරදියි. ඉස්සෙල්ලම තමන්ගේ වටේ තියෙන තාප්පය හදලා තමයි අනෙක් කොයි දේත් කරන්න ඕන. දැන් ඔබතුමා දන්නවා, සභාවේ මුදල් නාස්තිවෙච්ච විදිය කියන්නම්. ඔබතුමා බලන්න අවුරුදු විසිගානක් තිබ්ච්ච අර පයිප්ප ටික විකුණලා දැම්මා. සභාවක් එනවා. අපි අවුරුදු ගාණක් ඒක තියාගෙන ඉඳලා යෝජනාවක් ගෙනාවා. ඒ පයිප්ප දාන්න පාරවල් හදනකොට, ඇස්තමේන්තුවට නොදා. අපි ගෙනාවා යෝජනාවක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක දාන්න බෑ අබේසේකර මන්ත්‍රීතුමා. අවුරුදු 15ක් 20ක් තිබුණු බට දාන්න බෑ. මෙතුමා දන්නවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා විනාඩියක් ඇහුම්කන් දෙන්න. පයිප්ප දාන්න නෙමෙයි කිවුවේ. ඒ යෝජනාව ගේනකොට ඔබතුමා පක්ෂයි. අර ලොකු පයිප්පය අපි දානවා පාරක් හදනකොට ඇස්තමේන්තුවට ඇතුලත් කරන්නේ නැතුව. එතකොට පාර කඩන්න ඕන නෑ පයිප්ප යන්න පුළුවන්. ඒ යෝජනාව ගෙනාවා මේ සභාවේ. මමමයි ගෙනාවේ. ඒක ඇත්තටම එකක් තියෙනවා ඒ කාලය තුලදී ඒ පයිප්ප ටික වික්කා. ඒක අපරාධයක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකෙන් මුදලක් ඇවිල්ලානේ. රු.100.00ක් ආවත් එකෙන් මොකක්ද වෙච්ච හානිය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, මෙහෙම තියෙන්නේ. මම ඔබතුමාගෙන් ඉල්ලා හිටියා. අද ඔබතුමා හොඳ මානසිකත්වයෙන් ඉන්නවා. අපි මේක දිගටම අරන් යමු. අපිට ආරවුල් කරන්න නෙමෙයි ඕන. එකක් තියෙනවා හෘද සාක්ෂියක් තියෙනවා ඔබතුමාට. දැන් ඔබතුමන්ලා අපි ගෙනාපු යෝජනාවල් වේවා, මේවා එදා ගේනකොට කවදාවත් විරුද්ධ වුණේ නෑ. එතකොට මේක ගෙනාවේ සද්භාවයෙන්. ගේජ් එක වැඩි පයිප්ප මේ. අපි ඒ කාලයේත් විකුණන්න හදනකොට විකුණන්න දුන්නෙත් නෑ. ඔඩිට් රිපෝට් ආවත් දුන්නේ නෑ. ඒක ආවම තමයි යෝජනා කරේ පාර හරහා දාමු කියලා.

ගරු සභාපතිතුමනි, ඇත්තටම දැන් සමහර පාරවල් කරා. ඒක පොඩ්ඩක් පස්සේ කරන්න දාන්න පුළුවන්කම තිබුණා. ඊට ප්‍රමුඛයි මේක. ඔබතුමා අවංකව හිතන්න. මට උත්තරය ඕන නෑ. මේක හැදිල්ල ගැන එදා කියනකොටත් කිවුවා සල්ලි එන්න තියෙනවා කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ඒකට ඔබතුමාට අවංකව උත්තරය ලබා දෙන්නම්. අපේ මන්ත්‍රීවරුන්ට අවශ්‍යවුණා ආපු ගමන් වැඩ ටිකක් කරන්න. මම අවංකවම කියන්නම්. බොරු කියන්න ඕන නෑ.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම හිතන්නේ අපි කරපු කර්මාන්ත බැලුවම තාප්පයට වඩා ප්‍රමුඛතාවය දෙන්න ඕන කර්මාන්ත කරා ගම්වල. කාණු යටවෙන දේවල්, මීට වඩා ප්‍රමුඛත්වය දෙන්න ඕන දේවල් ගම්මානවල තිබුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අද වුණත් පරීක්ෂණයක් ඉල්ලන්න. මම එකඟයි. ඒකේ වැරැද්දක් වෙලා තියෙනවානම් අපි පරීක්ෂා කරලා බලමු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා කියන්න. දැන් මේ සභාවට ගෙනාවා පුටු. ඉඳගෙන වැඩ කරන්න බැරිතරම්, මකුණෝ කන ඒවා තිබුණේ නෑ. මේ ලංකාවේ කොහේවත් නෑ, සියලුම දෙනාට විධායක පුටු නෑ. මම අහන්නේ මේ මොකක්ද. මේක තුල කරේ වෙන මුකුත් නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා අපි අවංකව සතුටු වෙන්න ඕන. ඒ දේ වුණා. අපි සතුටු වෙන්න ඕන නිලධාරීන්ට එහෙම ඒ පුටුවල ඉන්නේ බෝපෙ පෝද්දල සභාවේ කියන එකට.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, ඔය පුටුවේ මම වාඩිවෙන්නේ නැනේ. ඔය පුටුව මෙතනට දැම්මොත් මොකද වෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා වාඩි වුණානේ මෙතන එක පාරක්. වාඩි වුණේ නැහැයි කියන්න එපා. වාඩිවුණානේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, අපිට හෘද සාක්ෂියක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ගැන පස්සේ කතා කරමු අබේසේකර මන්ත්‍රීතුමා.

<u>(ඊ) කාරක සභාවල වාර්තා</u>

<u>01. මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව.</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- I.** 2019.10.29 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි කමිටු තීරණ වලට විරුද්ධයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම හිතුවා අද හරි ඒක ඉවරයි කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක අපි ප්‍රතිපත්තියක් විදියට මේ ටිකේ ගේනවා. ඒක ඉස්සරහට වෙනස් කරමු.

ඒ වගේම ගරු සභාපතිතුමනි, මම ඔබතුමාගෙන් ඇහුවා පහුගිය සභාවේ අර සිරිධම්ම විද්‍යාලයේ නාට්‍යයක් පෙන්නුවා. ඒකට විනෝද බදු ගෙවන්න ඕන නෑ කිවුවා. මම දැක්කා කමිටු වාර්තාවේ දාලා තියෙනවා ඒක නිදහස් කරන්න. විනෝද බදු නිදහස් කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නාට්‍යයක් නෙමෙයි වෙන්න ඇති. සංගීත සංදර්ශනයක් වෙන්න ඇති. අරක නාට්‍යයක්. ඔබතුමා කිවුවේ නාට්‍ය ගැන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම කිවුවේ ඒක ගැන තමයි. නාට්‍යය නෙමෙයි. මේ තියෙන්නේ ඒක තමයි. මම මේක ගැන කිවුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔය ඒක නෙමෙයි අබේසේකර මන්ත්‍රීතුමා. ඒ තිබුණේ නාට්‍යයක්. කැළණි පාලමද, මොකක් හරි නාට්‍යයක්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කැළණි පාලම නෙමෙයි ගරු සභාපතිතුමා. ඒක ගැන තමයි මම කිවුවේ. මේකේ විස්තර මම ලබා දෙන්නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සංගීත ප්‍රසංගයක් නම් අවශ්‍යයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ තියෙන්නේ "ලබුදූව සිරිධම්ම විද්‍යාලයේ විදුහල්පතිතුමා විසින් කරන ලද ඉල්ලීම අනුව නීල නිම්නය විත් අපි මචං ප්‍රසංගයේ විනෝද බදු මුදල් නිදහස් කරනවා" කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔය කොයි කාලේ කරපු එකක්ද, ඔය පහුවෙලා ඉල්ලන එකක්. අරක තිබුණේ ගිය සතියෙද කොහෙද. ළඟදි තිබුණේ. නාට්‍යයක් අබේසේකර මන්ත්‍රීතුමා ළඟදි තිබුණේ. සති දෙකක් වුණේ නෑ තාම. මොකක්ද නාට්‍යයක් තිබුණේ. ඔය සංගීත ප්‍රසංගයක්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපේ විරෝධතාවය සඳහන් කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම නම් 2019-10-29 දින පැවති මුදල් ප්‍රතිපත්ති හා සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා බෙදීමකට යනවා.

ඉන්පසු ඡන්ද විමසීම ආරම්භ වූ අතර ඡන්දයේ ප්‍රතිඵලය පහත පරිදි විය.

පක්ෂව - 11
විපක්ෂව - 07
ඡන්දය ලබා දීමෙන් වැළකී සිටි - 03
සභා ගර්භයේ රැඳී නොසිටි - 01

**2019-10-29 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා පක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
04. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
07. ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
08. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
09. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
10. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
11. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා

**2019-10-29 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා විපක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
02. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
04. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
05. ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
06. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
07. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය

**2019-10-29 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා ඡන්දය ලබාදීමෙන් වැළකී සිටි පිරිස**

01. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
02. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
03. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

**2019-10-29 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා ඡන්දය විමසීමේදී සභා ගර්භයේ රැඳී නොසිටි පිරිස**

01. ගරු මන්ත්‍රිනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019-10-29 දින පැවති මුදල් ප්‍රතිපත්ති හා සැකසුම් කමිටු වාර්තාව වැඩි ඡන්ද හතරකින් සභා සම්මත විය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** II. 2019.11.11 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව.

2019-11-11 දින පැවති මුදල් ප්‍රතිපත්ති හා සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා බෙදීමකට යනවා.

ඉන්පසු ඡන්ද විමසීම ආරම්භ වූ අතර ඡන්දයේ ප්‍රතිඵලය පහත පරිදි විය.

පක්ෂව - 11
විපක්ෂව - 07
ඡන්දය ලබා දීමෙන් වැළකී සිටි - 03
සභා ගර්භයේ රැඳී නොසිටි - 01

**2019-11-11 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා පක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
04. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
07. ගරු මන්ත්‍රිනි ඩී.පී. වාසනා උදයංගනී මැතිණිය
08. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
09. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
10. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
11. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා

**2019-11-11 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා විපක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
02. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
04. ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා
05. ගරු මන්ත්‍රිනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
06. ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
07. ගරු මන්ත්‍රිනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය

**2019-11-11 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා ඡන්දය ලබාදීමෙන් වැළකී සිටි පිරිස**

01. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
02. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
03. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

**2019-11-11 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා ඡන්දය විමසීමේදි සභා ගර්භයේ රැඳි නොසිටි පිරිස**

01. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019-11-11 දින පැවති මුදල් ප්‍රතිපත්ති හා සැකසුම් කමිටු වාර්තාව වැඩි ඡන්ද හතරකින් සභා සම්මත විය.

**02. තාක්ෂණික සේවා කමිටුව ඃ-** නැත

**03. නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව ඃ-** නැත

**04. පරිසරය සහ පහසුකම් කමිටුව ඃ-** නැත

**(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම ඃ-**

01. ලැබීම් පිළිබඳ මාසික ප්‍රකාශ

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019 වර්ෂයේ ඔක්තෝම්බර් මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය (ප්‍රා.ස. 16)

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

02. වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019 වර්ෂයේ ඔක්තෝම්බර් මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය (ප්‍රා.ස.14)

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

03. එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තාව

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019 වර්ෂයේ ඔක්තෝම්බර් මස මාසික ඒකාබද්ධ හිඟ ආදායම් ප්‍රකාශය (ප්‍රා.ස. 07)

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

04. වෙනත් ලේඛන

I. ප්‍රගතිය

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019 වර්ෂයේ නොවැම්බර් මස මහා සභා රැස්වීමට ඉදිරිපත් කරන ලද ප්‍රගතිය

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** සභාපතිතුමා සුපුරුදු පරිදි වෙනදා අහන ප්‍රශ්නය අහන්න ඕන මට. මාධ්‍යවේදීන්ට ලියුම් යවලා නෑ මේ සැරෙත්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම කතා කරන්න හිටපු දෙයක්. අපි දිගටම කියනවා මේක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ඊලඟ සැරේ මම කරනවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** මම කියපු තුන්වෙනි අවස්ථාව මේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මගෙත් අඩුපාඩුවක් වුණා. අපේ මෙයා කිව්වා මට දාන්න බෑ කියලා. ඒකට මට වෙනත් ක්‍රමයක් උපයෝගී කරගන්න බැරි වුණා. ටෙල්සි මේක භාර අරන් කරන්න ඕන.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, වාර්තාව හදලා අපිට එවනවා ලියුමක්. ඒ එක්ක යවන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒත් එක්කම ලියුමක් යවන්නම් මාධ්‍යවේදීන්ට. අපේ සාහිත්‍ය උත්සවය තියෙනවා. ආරධනා පත්‍ර ලබාදීලා ඇති. ඒකට සහභාගී වෙන්න සියලුම මන්ත්‍රීවරු.

හරි බොහොම ස්තුතියි. ප්‍රගති වාර්තාව ස්ථිර කරන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

**II. ගෙවීම් අනුමැතියට ඉදිරිපත් කිරීම**

**1. පොදු ගෙවීම්** ඃ- නැත

**2. කර්මාන්ත ගෙවීම්** ඃ- නැත

**3. සේවක ණය ගෙවීම්** ඃ-නැත

**III. ඇස්තමේන්තු අනුමැතියට ඉදිරිපත් කිරීම** ඃ- නැත

**IV. මිල ගණන් කැඳවීම්** ඃ- නැත

**V. ලිපි ඉදිරිපත් කිරීම** ඃ- නැත

**(ළ) රැස්වීම් කැඳවීම් දැන්වීමේ දක්වා ඇති වෙනත් කාරණා** ඃ- නැත

මීළඟ මහා සභා රැස්වීම 2019.12.17 වන අඟහරුවාදා දින පෙ.ව 09.30ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ පැවැත්වෙන බව දන්වා සිටිමින් මහා සභා රැස්වීම අවසන් කරන ලදී.

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.